ISSN 2420-7381

සමාජ සංඛ්‍යානය ශාස්ත්‍රීය සංග්‍රහය

2023

දසවන වෙළුම, පළමු කලාපය

Journal of Social Statistics

2023

Volume 10, Issue 01

ප්‍රකාශනය
සමාජ සංඛ්‍යානය විෂය ශිෂ්‍ය සංගමය
සමාජ සංඛ්‍යානය අධ්‍යයන අංශය
කැලණිය විශ්වවිද්‍යාලය, කැලණිය, ශ්‍රී ලංකාව

සමාජ සංඛ්‍යානය ශාස්ත්‍රීය සංග්‍රහය - 2023, සමාජ සංඛ්‍යානය අධ්‍යයන අංශයේ සමාජ සංඛ්‍යානය විෂය ශිෂ්‍ය සංගම් වාර්ෂික ප්‍රකාශනය

මුද්‍රණය 2023 දෙසැම්බර්

ISSN 2420-7381

සංස්කාරක : ආචාර්ය එච්. ආර්. එස්. සුලෝචනී

සහකාර කථිකාචාර්ය ඩබ්. සී. එල්. වීරක්කොඩි

කවර නිර්මාණය : ඩබ්. සී. ලක්ෂානි

දසවන වෙළුම, පළමු කලාපය

මෙම ශාස්ත්‍රීය සංග්‍රහයේ ඇතුළත් ශාස්ත්‍රීය ලිපිවල අන්තර්ගත කරුණු සම්බන්ධ වගකීම කර්තෘන් සතුවන අතර, ඒ සඳහා සංස්කාරක මණ්ඩලය වගකීමක් නොදරයි.

කැලණිය විශ්වවිද්‍යාලයේ සමාජ සංඛ්‍යානය අධ්‍යයන අංශයේ සමාජ සංඛ්‍යානය විෂය ශිෂ්‍ය සංගමය විසින් ප්‍රකාශයට පත් කරන සමාජ සංඛ්‍යානය ශාස්ත්‍රීය සංග්‍රහයෙහි දසවන වෙළුම, පළමු කලාපය ප්‍රකාශන අනුග්‍රහය

සඟරා ලිපි විමර්ශන මණ්ඩලය

- මහාචාර්ය ඩබ්. එම්. සේමසිංහ (ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය)
  B.A. (Kel'ya), M.S.Sc (Kel'ya), Ph.D (Kel'ya)

- ආචාර්ය මංජුල ගුණරත්න මයා (ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය)
  B.A. (Kel'ya), M.S.Sc (Kel'ya), Ph.D (UMS)

- ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය එල්. ඩබ්. දසනායක මිය
  BSc. (Kel'ya), PG. Dip. (C'bo), MSSc. (Kel'ya)

- ආචාර්ය එච්. ආර්. එස්. සුලෝචනී මිය (ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය)
  B.A. (Kel'ya), M.A.(ROK), Ph.D (SNU)

- දිලුෂි කොඩිතුවක්කු මෙය (කථිකාචාර්ය)
  B.A. (Kel'ya), MSc. (Moratuwa), M.A. (C'bo)

Message from the Vice Chancellor

University of Kelaniya

It is with great pleasure that I give this congratulatory message for the 10th Journal of Social Statistics 2023, organized by the Social Statistics Students’ Association, Department of Social Statistics, University of Kelaniya.

Research activities are an important part in university culture, and they play a significant role when the undergraduates continue their postgraduate studies. Therefore “JSS (2023) – the 10th Journal of Social Statistics” will lead the new researchers on their way, in the correct path.

Throughout the last nine years the Department of Social Statistics has strongly encouraged students who are willing to share their research findings with others. The university itself encourages those who participate in this kind of work, and we hope that these research finings will help the future undergraduates also to improve their knowledge and interest in research work.

Therefore, I would like to extend my heartfelt gratitude to junior researchers who submitted their research to JSS for your invaluable contribution. Your rigorous research, innovative methodologies, and insightful analyses form the bedrock of academic progress in the field of Social Statistics. I am confident that this journal will inspire further generations of young researchers and encourage further exploration into vital areas of study.

As the Vice Chancellor of the University of Kelaniya, I wish the Social Statistics Students’ Association members, the organizing committee, the review panel, the editorial board and all the authors every success in their work.

Senior Professor Nilanthi de Silva
Vice Chancellor
University of Kelaniya

Message from the Dean

University of Kelaniya

It is with great pleasure to convey my message on the occasion of the “10th Jounral of Social Statistics (JSS) – 2023”, organized by the Social Statistics Students’ Association, Department of Social Statistics, University of Kelaniya.

Since undergraduates are the future researchers of a country, training them to conduct high quality research is essential. It is important to conduct research, but also to publish their findings in reputed journals as this enhance both their knowledge and contributes to national development. Therefore, the Faculty of Social Sciences always encourage the young researchers to explore the best opportunities to gain experience that can make their careers a success. Therefore, “JSS – 2023” will be a platform for those who are willing to publish their research findings.

I congratulate all the undergraduates who published their research findings in JSS – 2023 and wish every success.

Professor M.M. Gunatilake

Dean

Faculty of Social Sciences

University of Kelaniya

Message from the Head

Department of Social Statistics

As the Head of the Department of Social Statistics, I am pleased to share my thoughts on the 10th volume of the *Journal of Social Statistics*. The Department has always strived to provide ample opportunities for young researchers to explore new ideas, and it is encouraging to see that our students have greatly benefited from these efforts.

The *Journal of Social Statistics* serves as a valuable platform for undergraduates to engage in and develop their research capabilities. In this regard, it plays a vital role in motivating young researchers to publish meaningful and relevant research findings.

I would also like to take this opportunity to extend my sincere gratitude to the panel of reviewers for their time and dedication in reviewing the articles, as well as to the editorial committee and the Students' Association for their commitment and hard work in bringing this volume to fruition.

Senior Lecturer L. W. Dasnayake

Head

Department of Social Statistics

University of Kelaniya

සමාජ සංඛ්‍යානය විෂය ශිෂ්‍ය සංගමය

නිලධාරී මණ්ඩලය

සභාපති	උපේඛ විද්වන්ත
උප සභාපති	මහේෂ් සඳරුවන්
ලේකම්	ඩිල්කා රාජපක්ෂ
උප ලේකම්	ටනීෂා රණසිංහ
භාණ්ඩාගාරික	යශික ගුණරත්න
සඟරා සංස්කාරක	පියුමි රුවන්තිකා පියුමි කෞෂල්‍යා
කමිටු සාමාජිකයන්	නවීන් ජයසුන්දර සෙහානි කෞෂල්‍යා රවීන්ද්‍ර උදයංග අයේෂා ගොඩකන්ද
ජ්‍යෙෂ්ඨ භාණ්ඩාගාරික	එච්. ආර්. එස්. සුලෝචනී (ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය)

පටුන

පුද්ගලයින් මත්ද්‍රව්‍යවලට ඇබ්බැහි වීමට බලපාන සාධක අධ්‍යයනය……………...…………………………………………...…...01

Factors Affecting to the Adoption of Online freelancing among Undergraduates…………………………………………..……….16

University Students' Knowledge and Attitudes about the Transgender Community (Sample is Reference to University of Kelaniya)………………………………...…………..………33

ශ්‍රී ලංකාවේ වයස්ගත ජනගහනයේ ශ්‍රම සහභාගිත්වය සඳහා බලපාන හේතු සාධක පිළිබඳ අධ්‍යයනය (කොළඹ දිස්ත්‍රික්කය ඇසුරෙන්)………………………………..………………………...48

Factors Influencing Females Labour Force Participation in Sri Lanka..61

Journal of Social Statistics *Page 1 - 15*
JSS (2023) Vol (10) Issue (1)

පුද්ගලයින් මත්ද්‍රව්‍යවලට ඇබ්බැහි වීමට බලපාන සාධක අධ්‍යයනය

පී. පී. ඒ. එස්. ඩයස්[1]

සංක්ෂේපය

වර්තමානයේදී මත්ද්‍රව්‍ය භාවිතය ගෝලීය වශයෙන් මෙන්ම ශ්‍රී ලංකාව තුළ ද ප්‍රබල ගැටලුවක් බවට පත්ව තිබේ. පුද්ගලයින් මත්ද්‍රව්‍ය කෙරෙහි යොමු වීමට බලපාන සාධක හඳුනා ගැනීම සඳහා කාලීන අවශ්‍යතාවයක් වශයෙන් මෙම පර්යේෂණය සිදු කරන ලදි. උප අරමුණු වශයෙන් ආර්ථික සාධක, සමාජීය සාධක, ප්‍රජා විද්‍යාත්මක සාධක මෙන්ම පුද්ගලයින්ගේ ආදායම මත්ද්‍රව්‍යවලට ඇබ්බැහි වීමට ඇති කරන බලපෑම විමසා බැලීම සිදු කරයි. ශ්‍රී ලංකාවේ පළමු එළිමහන් සිර කඳවුර වීම මත පදනම්ව අධ්‍යයනය සඳහා පල්ලේකැලේ එළිමහන් සිරකඳවුර තෝරා ගන්නා ලදී. මෙම බන්ධනාගාරයෙන් පිරිමි රැඳවියන් 80ක නියැදියක් සම්භාවිතා නියැදුම් ක්‍රමයක් වන සරල සසම්භාවී නියැදීම යටතේ තෝරා ගන්නා ලදී. මත්ද්‍රව්‍ය සම්බන්ධයෙන් බන්ධනාගාර ගත වූ රැඳවියන් ඇසුරින් ප්‍රශ්නාවලියක් භාවිතා කොට ලබාගත් ප්‍රාථමික දත්ත භාවිතයෙන් අධ්‍යයනයෙහි මූලික අරමුණ වන මත්ද්‍රව්‍ය සඳහා යොමු වීමට බලපාන සාධක හඳුනාගැනීම සිදු කරන ලදී. එම දත්ත විශ්ලේෂණය සඳහා විස්තරාත්මක සංඛ්‍යාන ක්‍රම, සාධක විශ්ලේෂණය, කයි වර්ග පරීක්ෂාව යන දත්ත විශ්ලේෂණ ක්‍රම යොදා ගන්නා ලදී. බාහිර බලපෑම, සමාජයීය බලපෑම, මානසික බලපෑම සහ අන්තර් පුද්ගල බලපෑම යන සාධක පුද්ගලයෙකු මත්ද්‍රව්‍ය කෙරෙහි ඇබ්බැහි කරවීමට සමත් බව සාධක විශ්ලේෂණය තුළින් හඳුනාගත හැකිවිය. පවුලේ මාසික ආදායම, වයස මත්ද්‍රව්‍යවලට ඇබ්බැහි වීමට බලපාන ප්‍රජා විද්‍යාත්මක සාධක බව කයිවර්ග පරීක්ෂාව මගින් තහවුරු විය. මත්ද්‍රව්‍ය භාවිතයට මුලින්ම යොමු වන වයස් සීමාව පිළිබඳව සැළකීමේදී බහුතරයක් පුද්ගලයින් වයස අවුරුදු 18ත් 24ත් අතර වයස් මට්ටමකදී ප්‍රථම වරට යම් මත්ද්‍රව්‍යයක් භාවිතා කිරීමට යොමුවී ඇත. බහුතරය හෙරොයින් භාවිතා කරන්නන් වේ. ශ්‍රී ලංකාව තුළ මත්ද්‍රව්‍ය භාවිතය හා ව්‍යාප්තිය අවම කිරීමෙහිලා ඊට අනුබද්ධිත නීති රීති දැඩි කිරීමත්, අධ්‍යාපනික සහ ආගමික වශයෙන් සමාජ උපදේශනයේ අවශ්‍යතාවයත් නිර්දේශ කළ හැකිය.

මුඛ්‍ය පද : ඇබ්බැහි වීම, මත්ද්‍රව්‍ය, ශ්‍රී ලංකාව, මත්ද්‍රව්‍ය ව්‍යාප්තිය, රැඳවියන්

1. හැඳින්වීම

මත්ද්‍රව්‍ය භාවිතය සහ මත්ද්‍රව්‍යවලට ඇබ්බැහි වීම මෑත කාලීන සංසිද්ධියක් නොවේ. එය ලෝකයේ බොහෝ රටවල් මුහුණ දෙන සංකීර්ණ, බහුවිධ සමාජ ගැටලුවකි. මත්ද්‍රව්‍යවලට ඇබ්බැහි වීම සංවර්ධනය වෙමින් පවතින සහ ඌන සංවර්ධිත රටවල පවතින පොදු සමාජ ගැටලුවක් වන බැවින් එය සමකාලීන ලෝකයේ ප්‍රධාන

---

[1] *සමාජ සංඛ්‍යානය අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය*
anomadias99@gmail.com

ප්‍රශ්නයක් බවට පත්ව ඇත (Mahir & Wazeema, 2020). මත්ද්‍රව්‍ය යනු ජවාරමකි. එනම් සංවිධානාත්මක අපරාධ කණ්ඩායම් විසින් මෙහෙය වන එකිනෙකට සම්බන්ධය වූ ජාලයක් ලෙස දැක්විය හැක. මෙම මත්ද්‍රව්‍ය ජාවාරම සංවිධානාත්මක අපරාධ කණ්ඩායම්වලට වඩාත්ම ලාභදායි ක්‍රියාවක් වේ (International Narcotics Control Board – INCB, 2022). එසේම මත්ද්‍රව්‍ය භාවිතය තිරසාර මානව සංවර්ධනය කෙරෙහි සහ අපරාධ ඉහළ යාම කෙරෙහි බලපායි. එය රටක ස්වාධීනත්වය, ප්‍රජාතන්ත්‍රවාදය මෙන්ම සමාජයේ සියලුම අංශවලට බලපායි (Nimalaweera, 1970).

මධ්‍යසාර, නිකොටින් හෝ කැෆේන් හැර ගංජා, කොකේන්, MDMA, ඇම්ෆෙටමින්, LSD (Lysergic Acid Diethylamide), Magic mushrooms, Prescription Opioids, Ketamine, Poppers, Creak ගෝලීය වශයෙන් බහුලව භාවිතා වන මත්ද්‍රව්‍ය වේ (Loesche, 2017). මත්ද්‍රව්‍යවලට ඇබ්බැහි වූවන්ගෙන් වැඩි දෙනෙක් තරුණයින් වේ. මත්ද්‍රව්‍ය නීත්‍යානුකූල මත්ද්‍රව්‍ය සහ නීති විරෝධී මත්ද්‍රව්‍ය ලෙස වර්ග දෙකකට වෙන් කර ඇත. පසුගිය දශක දෙක තුළ ලොව පුරා නීති විරෝධී මත්ද්‍රව්‍ය භාවිතය ඉතා තියුණු ලෙස ඉහළ ගොස් ඇත (Mahir & Wazeema, 2020). ලෝකයේ බහුලව භාවිතා වන මත්ද්‍රව්‍ය ගංජා වේ. 2020 දී ලොව පුරා වයස අවුරුදු 15-64 අතර පුද්ගලයින් මිලියන 284ක් පමණ මත්ද්‍රව්‍ය භාවිතා කළ අතර එය 2010 සාපේක්ෂව සියයට 26ක වැඩි වීමකි. (United Nations Office on Drugs and Crime - UNODC, 2022). මත්ද්‍රව්‍ය භාවිතය සඳහා ඇබ්බැහිවූවන් මත්ද්‍රව්‍ය ශරීරගත කර ගැනීමට අනුගමනය කරනු ලබන මාර්ග ලෙස එන්නත් කිරීම, ආහාර පාන ලෙස හෝ දුමක් ලෙස භාවිතා කිරීම දැක්විය හැකිය. මත්ද්‍රව්‍ය ශරීරගත කර ගන්නා මාර්ග තීරණය වීම කෙරෙහි භාවිතා කරන මත්ද්‍රව්‍ය වර්ගය, එහි ගුණාත්මකභාවය සහ මිල ගණන් බලපානු ලබයි (අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලය, 2016).

ලෝකය පුරාම හඳුනාගත හැකි ගැටලුවක් බවට මෙන්ම ආසියාවේ ප්‍රමුඛ ගැටලුවක් බවට මත්ද්‍රව්‍ය පත්ව ඇත (Herath & Ambekar, 2017). ඉන්දියාව, භූතානය, බංගලාදේශය, නේපාලය සහ ශ්‍රී ලංකාව මෙම කලාපයේ මත්ද්‍රව්‍ය භාවිතය වැඩි වශයෙන් පවතින රටවල් වේ. හෙරොයින්, ගංජා, අබිං මෙම රටවල බහුලව භාවිතා වන මත්ද්‍රව්‍ය වේ. වෙනත් මත්ද්‍රව්‍ය සමඟ මත්පැන් සහ දුම්කොළ භාවිතය ද මෙම රටවල දක්නට ලැබේ. වයස අවුරුදු 17ට අඩු පුද්ගලයින් හෙරොයින්වලට ඇබ්බැහි වීම සහ අවුරුදු 18-20 වයස් කාණ්ඩවල පුද්ගලයින් ගංජා භාවිතා කිරීම දකුණු ආසියානු කලාපයෙන් වාර්තා වී ඇත (Mahir & Wazeema, 2020). ශ්‍රී ලංකාවේ මත්ද්‍රව්‍ය භාවිතය සහ ව්‍යාප්තිය වඩාත් තීරණාත්මක ගැටලුවක් වී තිබේ. 1980 දශකයේ දී හෙරොයින් මෙරටට ඇතුළු වූයේ ප්‍රධාන වශයෙන්ම සංචාරක ව්‍යාපාරය හරහාය. ශ්‍රී ලංකාව මත්ද්‍රව්‍ය භාවිත කරන රටක් ලෙසත් මත්ද්‍රව්‍ය ප්‍රවාහන මධ්‍යස්ථානයක් ලෙසත් ලෝකයේ ප්‍රසිද්ධය (Dasanayake, 2019). එහි ප්‍රතිඵලයක් ලෙස, 2021 වර්ෂයේදී මත්ද්‍රව්‍ය හේතුවෙන් බන්ධනාගාරගත වූ මුළු පුද්ගලයන්

සංඛ්‍යාව 19,856කි (National Dangerous Drugs Control Board - NDDCB, 2022). මත්ද්‍රව්‍යවලට ඇබ්බැහිවූවන් වෙනුවෙන් ශ්‍රී ලංකාවේ බන්ධනාගාර 05ක් ඇත. එනම් පල්ලෙකැලේ, තල්දෙන, වීරවිල, පල්ලන්සේන, අඹේපුස්ස වේ. මෙම බන්ධනාගාර හැරුණු විට අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලය විසින් පූර්ව අනුමත කරන ලද වෙනත් රජයේ සහ පෞද්ගලික අංශයේ නේවාසික පුනරුත්ථාපන මධ්‍යස්ථාන තිබේ. (Jayamaha et al., 2022).

ශ්‍රී ලංකාව මත්ද්‍රව්‍ය භාවිතය පාලනය කිරීම සඳහා නිර්මාණය කර ඇති නීති සහ ප්‍රතිපත්ති සහ මත්ද්‍රව්‍යවලට ඇබ්බැහිවූවන් සඳහ ගෙන ඇති ක්‍රියාමාර්ග ශ්‍රී ලංකාවේ මත්ද්‍රව්‍ය ක්ෂේත්‍රයේ ප්‍රධාන වෙනසක් හෝ අපේක්ෂිත ප්‍රතිඵලය ලබා දීමට සමත් වී නැත (Silva & Fonseka,2008). මත්ද්‍රව්‍යවලට ඇබ්බැහිවීම ශ්‍රී ලංකාවේ ප්‍රධාන සමාජ ගැටලුවලින් එකක් සහ සැලකිය යුතු මහජන සෞඛ්‍ය ගැටලුවක් බවට පත්ව තිබේ. එබැවින් මත්ද්‍රව්‍යවලට ඇබ්බැහි වීමට බලපාන ප්‍රමුඛ සාධක හඳුනාගැනීම වැදගත් වේ.

1.1 පර්යේෂණ අරමුණු

මත්ද්‍රව්‍යවලට ඇබ්බැහි වීමට බලපාන සාධක මොනවාද යන්න අධ්‍යයනය කිරීම මෙම අධ්‍යයනයේ අරමුණයි. මත්ද්‍රව්‍යවලට ඇබ්බැහි වූ පුද්ගලයින්ගේ ප්‍රජා විද්‍යාත්මක, සමාජ ආර්ථික ලක්ෂණ අධ්‍යයනය කිරීම සහ ප්‍රජා විද්‍යාත්මක ලක්ෂණ සහ සාධක අනෙකුත් සමාජ ආර්ථික ලක්ෂණ අතර සම්බන්ධය අධ්‍යයනය කිරීම සෙසු අරමුණු වේ.

2. සාහිත්‍යය විමර්ශනය

වසර මිලියන 200කට පමණ පෙර මත්ද්‍රව්‍ය භාවිතය ආරම්භ වී ඇත. වර්තමානය වන විට මත්ද්‍රව්‍ය භාවිතය ගෝලීය ඉතිහාසයේ ඉහළම මට්ටමට පැමිණ තිබේ (Saah, 2005). පුද්ගලයෙකු මත්ද්‍රව්‍යවලට යොමු වීමට බලපාන සාධක ගණන වැඩි වන තරමට මත්ද්‍රව්‍යවලට ඇබ්බැහි වීමේ ප්‍රවණතාව වැඩි වේ (Chaman et al., 2020). මත්ද්‍රව්‍යවලට ඇබ්බැහි වීමට බලපාන සමාජ, ආර්ථික, ප්‍රජා විද්‍යාත්මක සාධක පිළිබඳ පෙර කරන ලද පර්යේෂණ අධ්‍යයනය කිරීම වැදගත් වේ.

National Institute On Drug Abuse (2023) වාර්තාවට අනුව පවුල් ව්‍යුහයේ ගැටලු පවතී නම් මත්ද්‍රව්‍යවලට යොමු වීමට ඉහළ ඉඩක් ඇත බව පෙන්වා දී ඇත. ළමයින් හොඳින් රැකබලා නොගන්නා විට, කලත්‍රයා සමග ගැටුම් ඇති විට මත්ද්‍රව්‍යවලට ඇබ්බැහි විමට ඉහළ සම්භාවිතාවක් පවතී. Nkonge (2017) විසින් මත්පැන් පානය කරන පවුල් පිළිබඳ සිදු කළ අධ්‍යයනයකට අනුව බොහෝ විවාහ ගැටලු ආරම්භ වන්නේ මත්පැන් භාවිතය නිසා බව සොයාගෙන ඇත. මත්පැන් සහ මත්ද්‍රව්‍ය අනිසි භාවිතය, දික්කසාදයට ප්‍රධාන හේතුවක් ලෙස දක්වා ඇත. තවද කාන්තාවන් මත්ද්‍රව්‍ය භාවිතයට යොමුවීම ආශ්‍රිත සාහිත්‍ය විමර්ශනය කිරීමේදී

පැහැදිලි වන කරුණක් නම්, කාන්තාවන් මත්ද්‍රව්‍ය භාවිතයට යොමු වීම කෙරෙහි බලපානු ලබන ප්‍රබලම සහ ආසන්නතම සාධකය බවට පත්ව ඇත්තේ සිය සහකරුවා හෝ සමීපතමයන්ගේ මත්ද්‍රව්‍ය භාවිතයයි (අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලය, 2016).

බොහෝ විට තරුණයන් වැඩිවියට පැමිණීමේදී, බොහෝ කරදර සහ කලකිරීම් අත්විඳිති. සම වයසේ මිතුරන් විසින් දක්වන පරිදි ඔවුන් එම පීඩාවලින් මිදීම සඳහා මත්ද්‍රව්‍ය භාවිතා කරති (Adoga, 2018). Sulaiman සහ Zainuddin (2021) ට අනුව මිතුරන්ගේ බලපෑම් තුළින් මත්ද්‍රව්‍ය අත්හදා බැලීමට දිරිමත් කරති. පෙර පර්යේෂණවලින් පෙන්නුම් කළේ ප්‍රතිචාර දැක්වූවන්ගෙන් 50%ක් මත්ද්‍රව්‍ය අත්හදා බැලීමට තම මිතුරන් ආරාධනා කළ විට ම පිළිගත් බව බවයි. එමෙන්ම පුද්ගලයන් තරුණ වියේදී මත්ද්‍රව්‍ය භාවිතයට යොමු වීමට තම වටපිටාවේ ඇති වන පීඩනය ද බලපායි. මත්ද්‍රව්‍යවලට ඇබ්බැහි වීම වැළැක්වීමට සහ මත්ද්‍රව්‍ය භාවිතය නැවැත්වීමට ධනාත්මක අසල්වැසි බලපෑම වැදගත් වේ. මැලේසියාවේ බන්ධනාගාර ආශ්‍රිතව මත්ද්‍රව්‍ය අනිසි ලෙස භාවිතා කර ලද සිරකරුවන් අතර මානසික, සමාජීය බලපෑම පිලිබඳ පර්යේෂණයේ දී, අසල්වැසි බලපෑම යනු සිරකරුවන්ට බලපාන වඩාත්ම ප්‍රධාන සාධකයක් ලෙස හඳුනා ගන්නා ලදී.

වර්තමානයේ මත්ද්‍රව්‍ය අලෙවි කිරීම සහ මිලදී ගැනීම සඳහා අන්තර්ජාලය ජනප්‍රිය මෙවලමක් වී ඇත. අන්තජාලයේ අලෙවි කරන මත්ද්‍රව්‍ය අතුරින් 48% මරිජුවානා සහ එක්ස්ටසි වැනි නීති විරෝධී මත්ද්‍රව්‍ය වන බව සොයාගෙන ඇත. අන්තර්ජාලය හරහා මත්ද්‍රව්‍ය විකුණුම්කරුවන් සහ ගැනුම්කරුවන් යන දෙපාර්ශවයටම ඔවුන්ගේ නිර්නාමිකභාවය පවත්වා ගැනීමට හැකි වේ. මැලේසියාවේ ෆෙස්බුක් සමාජ ජාලය හරහා මැලේසියාව තුළ ස්ටෙරොයිඩ් (Steroids) අලෙවිය නීති විරෝධී ලෙස සිදු කරන බව සොයා ගැනීමත් සමඟ මෙය සනාථ වේ (Tam & Foo, 2012). තරුණයින් අතර සමාජ මාධ්‍ය භාවිතය සහ මත්ද්‍රව්‍ය භාවිතය අතර සම්බන්ධයක් පවතින බව Extension (2023) විසින් පෙන්වා දෙන ලදී.

මානසික සෞඛ්‍යය ගැටලු වන මානසික අවපීඩනය, වර්ධනයේ ප්‍රමාදය, උදාසීනත්වය සහ වෙනත් මානසික සමාජීය අක්‍රමිකතා නිතරම යෞවනයන් අතර මත්ද්‍රව්‍ය අනිසි භාවිතයට යොමු කිරීමට හේතු වේ (Hilliard, 2019). මත්ද්‍රව්‍ය භාවිතය සෞඛ්‍යයට සහ ආයු අපේක්ෂාවට බලපෑම් ඇති කරයි. එය මානසික අර්බුද ඇතුළු බහුවිධ ගැටළු සමඟ සම්බන්ධ වේ (Adoga, 2018). Windarwati සහ Ati (2021) පෙන්වා දෙන්නේ, දුම්පානය සහ මත්ද්‍රව්‍ය අනිසි භාවිතය යෞවනයන් තුළ ආතතිය, කාංසාව සහ මානසික අවපීඩනය වැනි චිත්තවේගීය ආබාධ සමඟ සම්බන්ධ වන බවයි.

Kaestner (1998) ට අනුව මත්ද්‍රව්‍ය භාවිතය දරිද්‍රතාවය සමඟ මූලික වශයෙන් සම්බන්ධ වන්නේ ශ්‍රම වෙළෙඳපොළේ ප්‍රතිඵල මත වන නමුත් එය පවුල් සංයුතියට

ද බලපානු ලබයි. පවුල් සංයුතිය දරිද්‍රතාවයට බලපාන්නේ පවුලේ ප්‍රමාණය, සහ උපයා ගන්නා ආදායම් මතයි. ශ්‍රම වෙළෙඳපොළ ප්‍රතිඵල තීරණය කරනු ලබන්නේ පුද්ගලයෙකුගේ මානව ප්‍රාග්ධනය මගිනි. මත්ද්‍රව්‍ය භාවිතය සහ දරිද්‍රතාවය සම්බන්ධ වන්නේ මත්ද්‍රව්‍ය භාවිතය දරිද්‍රතාවයේ නිර්ණායකයන්ට බලපාන බැවිනි. මත්ද්‍රව්‍ය භාවිතය ඵලදායිතාව අඩු කිරීමටත්, ඉපැයීම් අඩු කිරීමටත්, දරිද්‍රතාවයේ ඉහළ නැංවීමටත් හේතු වේ. එසේම මත්ද්‍රව්‍ය භාවිතය අධ්‍යාපනයට අහිතකර ලෙස බලපෑ හැකි අතර එම නිසා ඉපැයීම් අඩු වී දරිද්‍රතාවය වැඩි කරයි.

පූර්ව අධ්‍යයනයන් අනුව ආර්ථික පසුබෑම, රැකියා අහිමිවීම නිසා ඇති වන ආතතීන් සහ මත්පැන් පානය වැඩිවීම අතර සම්බන්ධයක් ඇති බවයි. විරැකියාව මත්පැන්, මරිජුවානා සහ නීති විරෝධී මත්ද්‍රව්‍ය භාවිතය ඇතුළු ගැටළුකාරී මත්ද්‍රව්‍ය භාවිතය සමඟ දැඩි ලෙස සම්බන්ධ වී ඇත. ඕස්ට්‍රේලියාවේ ජාත්‍යන්තර අධ්‍යයනයකින් හෙළි වූයේ ආර්ථික පසුබෑම තරුණ වැඩිහිටියන් අතර මරිජුවානා මත්ද්‍රව්‍ය භාවිතයේ වාර ගණන සමඟ සැලකිය යුතු ලෙස සම්බන්ධ වී ඇති බවයි. තවද, විරැකියා අනුපාතිකය අඩු වීමත් සමඟ තරුණ වැඩිහිටියන් හා යෞවනයන් අතර මරිජුවානා සහ අනෙකුත් නීති විරෝධී මත්ද්‍රව්‍ය අලෙවිය සහ භාවිතය වැඩි වී ඇති බව බහු අධ්‍යයනවලින් සොයාගෙන ඇත (Azagba et al., 2021). පර්යේෂකයන් වැඩි දුරටත් පැහැදිලි කළේ විශාල මුදල් ප්‍රමාණක් තිබීම මත්ද්‍රව්‍ය ලබා ගැනීමේදී ඇති විය හැකි බාධක ඉවත් කරයි. එබැවින් ඉහළ මුදල් ප්‍රමාණයක් පැවතීම නීතිවිරෝධී මත්ද්‍රව්‍ය සඳහා ප්‍රවේශ වීමේ හැකියාව ඉහළ යාමට දායක වන එක් සාධකයක් බවට පත්ව ඇත (Tam & Foo, 2012).

3. අධ්‍යයන ක්‍රමවේදය

මෙම අධ්‍යයනය ශ්‍රී ලංකාවේ පළමු එළිමහන් සිර කඳවුර වන පල්ලේකැලේ එළිමහන් සිරකඳවුර මූලික කොටගෙන සිදු කරනු ලබයි. මෙම බන්ධනාගාරයේ 2022 වර්ෂයේ දෙසැම්බර් මාසයේ මත්ද්‍රව්‍ය වැරදි හේතුවෙන් බන්ධනාගාර ගත වු මුළු පිරිමි රැඳවියන් 381ක මෙම අධ්‍යයනයේ සංගහන රාමුව වේ.

පර්යේෂණයට අදාළ නියැදිය තෝරා ගැනීමේදී මත්ද්‍රව්‍යවලට ඇබ්බැහි වූ රැඳවියන් සම්භාවිතා නියැදුම් ක්‍රමයේ සරල සසම්භාවි නියැදුම් ක්‍රමය හරහා තෝරා ගෙන ඇත. මෙහිදි 90%ක විශ්වාසනීය මට්ටම යටතේ රැඳවියන් 80ක් අධ්‍යයනය සඳහා යොදාගන්නා ලදී. මෙහි දී යමානී ක්‍රමය භාවිතා කරමින් දෝෂය අවම වන පරිදි නියැදියේ ප්‍රමාණය තෝරා ගන්නා ලදි. මත්ද්‍රව්‍ය භාවිතයේ ව්‍යාප්තිය සහ වර්තමාන ප්‍රවණතා පිළිබඳ අධ්‍යයනය කිරිම සඳහා ප්‍රාථමික දත්ත හා ද්විතීයික දත්ත යොදා ගනී. ප්‍රශ්නාවලි ක්‍රමය මගින් ප්‍රාථමික දත්ත රැස් කරගනු ලබන අතර ද්විතීයික දත්ත ජාතික අන්තරායකර ඖෂධ පාලන මණ්ඩලයේ 2021, 2022 වාර්තා හා ශ්‍රී ලංකා බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ 2022 වාර්තා මගින් ලබා ගන්නා ලදී.

4. දත්ත විශ්ලේෂණය

ප්‍රශ්නාවලි හරහා රැස්කරගත් දත්ත අනුව මෙහිදී දත්ත විශ්ලේෂණය සිදුකර ඇත. දත්ත විශ්ලේෂණය කිරීමේදී හා ඉදිරිපත් කිරීමේදී SPSS මෘදුකාංගය හා Microsoft Excel පැකේජය යොදාගෙන ඇත.

4.1 මත්ද්‍රව්‍යවලට ඇබ්බැහි වු පුද්ගලයින්ගේ ප්‍රජා විද්‍යාත්මක, සමාජ ආර්ථික ලක්ෂණ අධ්‍යයනය

ප්‍රස්තාර සටහන 1: මත්ද්‍රව්‍යවලට ඇබ්බැහි වු පුද්ගලයින්ගේ පදිංචියේ ව්‍යාප්තිය



මූලාශ්‍රය : නියැදි සමීක්ෂණ දත්ත, 2023

ප්‍රස්තාර 1 සටහනට අනුව මත්ද්‍රව්‍යවලට ඇබ්බැහි වූවන්ගෙන් 75%ක් නාගරික ජීවත් වී ඇති අතර 25%ක් ග්‍රාමීය ජීවත් වී ඇත. නාගරික ප්‍රදේශ ආශ්‍රිතව මත්ද්‍රව්‍ය භාවිතයේ ඉහළ ප්‍රවණතාවයක් දැක ගත හැකිය.

ප්‍රස්තාර සටහන 1 : මත්ද්‍රව්‍යවලට ඇබ්බැහි වු පුද්ගලයින්ගේ වයස් ව්‍යාප්තිය



මූලාශ්‍රය : නියැදි සමීක්ෂණ දත්ත, 2023

ප්‍රස්තාර 2 සටහනේ දැක්වෙන පරිදි මත්ද්‍රව්‍යවලට ඇබ්බැහි වූ මුළු පුද්ගලයින්ගෙන් 33.80%ක් 31-35 වයස් කාණ්ඩයට අයත් වේ. මත්ද්‍රව්‍යවලට ඇබ්බැහි වූ පුද්ගලයින්ගෙන් 6.30%ක් 18-24 වයස් කාණ්ඩයට අයත් වන අතර 12.50%ක් 25-30 වයස් කාණ්ඩයට අයත් වේ. 18.80%ක් 41-45 වයස් කාණ්ඩයට අයත් වේ. මත්ද්‍රව්‍යවලට ඇබ්බැහි වූ පුද්ගලයින්ගෙන් 45ට වැඩි වයස් කාණ්ඩයේ සිටින්නේ මුළු පිරිසෙන් 11.30%ක් පමණි. මේ අනුව පැහැදිලි වන්නේ මත්ද්‍රව්‍යවලට ඇබ්බැහි වූ පුද්ගලයින්ගේ ඉහළම අගයක් වාර්තා වන්නේ තරුණ වයස් කාණ්ඩයේ ය.

වගු අංක 1 : මත්ද්‍රව්‍යවලට ඇබ්බැහි වූ පුද්ගලයින්ගේ අධ්‍යාපන මට්ටමේ සංඛ්‍යාත ව්‍යාප්තිය

අධ්‍යාපන මට්ටම	සංඛ්‍යාත	ප්‍රතිශතය %
පාසල් නොගිය	4	5.0
1 - 5 ශ්‍රේණිය	18	22.5
6 - 10 ශ්‍රේණිය	18	22.5
සාමාන්‍ය පෙළ	28	35.0
උසස් පෙළ	12	15.0
එකතුව	80	100.0

මූලාශ්‍රය : නියැදි සමීක්ෂණ දත්ත, 2023

වගු අංක 1 ට අනුව මත්ද්‍රව්‍යවලට ඇබ්බැහි වූ පුද්ගලයින්ගෙන් වැඩි පිරිසක් සාමාන්‍ය පෙළ දක්වා අධ්‍යාපනය ලබා ඇත. එය ප්‍රතිශතයක් ලෙෂ 35%ක් වේ. මෙම මත්ද්‍රව්‍යවලට ඇබ්බැහි වූ පුද්ගලයින්ගෙන් 5%ක් කිසිදා පාසල් නොගිය අය වේ. මුළු පුද්ගලයින්ගෙන් 15%ක් උසස් පෙළ දක්වා අධ්‍යාපනය ලබා ඇත.

ප්‍රස්තාර සටහන 3 : පළමු වරට මත්ද්‍රව්‍ය හඳුන්වා දුන් පුද්ගලයා



මූලාශ්‍රය : නියැදි සමීක්ෂණ දත්ත, 2023

ප්‍රස්තාර සටහනට 3 ට අනුව වැඩි පිරිසකට මුල් වරට මත්ද්‍රව්‍ය හඳුන්වා දී ඇත්තේ මිතුරන් විසින්ය. එය ප්‍රතිශතයක් ලෙස 66.30% වේ. තමන් විසින්ම මත්ද්‍රව්‍ය භාවිතයට යොමු වූ පිරිස 28.80%ක් වේ. විදේශීකයෙක් විසින් පළමු වරට මත්ද්‍රව්‍ය හඳුනා ගත් පුද්ගලයන් සංඛ්‍යාව 2.50%ක් වේ. පවුලේ සාමාජිකයෙක් සහ වෙළෙන්දෙක් විසින් පළමු වරට මත්ද්‍රව්‍ය හඳුනා ගත් පුද්ගලයින්ගේ ප්‍රතිශතය සමාන වන අතර එය 1.30%ක් වේ.

ප්‍රස්තාර සටහන 4 : මූලින්ම මත්ද්‍රව්‍ය භාවිතායට යොමුවීමේ සාමාන්‍ය වයස



මූලාශ්‍රය : නියැදි සමීක්ෂණ දත්ත, 2023

ප්‍රස්තාර සටහන 4 ට අනුව මත්ද්‍රව්‍යවලට ඇබ්බැහි වූ පුද්ගලයින්ගෙන් 41.25%ක් මූලින්ම මත්ද්‍රව්‍ය භාවිතයට යෙමු වී ඇත්තේ වයස අවුරුදු 18-24 අතර වයසේ දී වේ. වයස අවුරුදු 18ට අඩු වයසේ දී මත්ද්‍රව්‍ය භාවිතයට යොමු පුද්ගලයින් සංඛ්‍යාව 13.75%ක් වේ. 26.25%ක් මූලින්ම මත්ද්‍රව්‍ය භාවිතයට යෙමු වී ඇත්තේ වයස අවුරුදු 25-30 අතර දී වේ. මේ අනුව පැහැදිලි වන්නේ වැඩි පුද්ගලයන් සංඛ්‍යාවක් පළමු වරට මත්ද්‍රව්‍යවලට යොමු වී ඇත්තේ නව යොවුන්වියේ දී සහ තරුණ වයසේ දී ය.

ප්‍රස්තාර සටහන 5 : මත්ද්‍රව්‍යවලට ඇබ්බැහි වූ පුද්ගලයන් භාවිතා කළ ඇති මත්ද්‍රව්‍ය වර්ග



මූලාශ්‍රය : නියැදි සමීක්ෂණ දත්ත, 2023

ප්‍රස්තාර 5 සටහනට අනුව පුද්ගලයින් වැඩි ප්‍රමාණයක් භාවිතා කර ඇති මත්ද්‍රව්‍ය වර්ගය හෙරොයින් වේ. එය ප්‍රතිශතයක් ලෙස 67.5% වේ. අයිස් මත්ද්‍රව්‍ය පුද්ගලයින් 58.8%ක ප්‍රතිශතයක් භාවිතා කර ඇත. මීට අමතරව 53.8%ක් දුම්කොළ ආශ්‍රිත නිෂ්පාදන සඳහා ඇබ්බැහි වී ඇත. ගංජා සඳහා 50.0%ක් ද, මත්පැන් සඳහා 50.0%ක් ද, කොකේන් සඳහා 18.8%ක් ද, මනෝව්‍යර්ථක ඖෂධ සඳහා 13.8%ක් ද ඇබ්බැහි වී ඇත. හෂිස් මත්ද්‍රව්‍ය පුද්ගලයින් 8.8% ප්‍රතිශතයක් භාවිතා කර ඇත. 5%ක් විවිධ වර්ගයේ මත්ද්‍රව්‍ය සඳහා ඇබ්බැහි වී ඇත.

ප්‍රස්තාර සටහන 6 : මත්ද්‍රව්‍ය භාවිතා කිරීමේ ක්‍රමය



මූලාශ්‍රය : නියැදි සමීක්ෂණ දත්ත, 2023

ප්‍රස්තාර 6 සටහනට අනුව 78.8%ක් ප්‍රමාණයක් මත්ද්‍රව්‍ය ශරීරගත කර ගෙන ඇත්තේ පානය කිරීම මගිනි. ආශ්වාසය මගින් 53.8%ක් මත්ද්‍රව්‍ය ශරීරගත කර ගෙන ඇති අතර එන්නත්කරණය මගින් 7.5%ක් මත්ද්‍රව්‍ය ශරීරගත කර ගෙන ඇත. මත්ද්‍රව්‍ය ශරීරගත කර ගැනීමට වෙනත් ක්‍රම 8.8%ක් පිරිසක් යොදා ගනී.

4.2 පුද්ගලයින් මත්ද්‍රව්‍යවලට ඇබ්බැහි වීමට බලපාන හේතු සාධක පිළිබඳ ප්‍රධාන සංරචක විශ්ලේෂණය

මත්ද්‍රව්‍යවලට ඇබ්බැහි වීමට බලපාන හේතු සාධක 14ක් පිළිබඳව රැස් කරගත් දත්ත සඳහා ප්‍රධාන සංරචක විශ්ලේෂණය සිදු කොට ඇත.

සාධක විශ්ලේෂණයේදී KMO අගය මගින් නියැදියේ ප්‍රමාණවත් බවත් පරීක්ෂා කරනු ලබයි. KMO අගය 0.6ට වඩා විශාල විය යුතු අතර Bartlett අගයෙහි P අගය 0.05ට වඩා අඩු අගයක් ගත යුතුය.

වගුව 2 ට අනුව, KMO හි අගය 0.658 නිසා විචල්‍යයන් අතර සම්බන්ධතාවයේ ප්‍රබලතාව ශක්තිමත් බව නිගමනය කළ හැකිය.

වගු අංක 2 ෘ KMO සහ Bertlett’s පරීක්ෂාව

Kaiser-Meyer-Olkin Measure of Sampling Adequacy.		.658
Bartlett's Test of Sphericity	Approx. Chi-Square	568.116
	Df	91
	Sig.	.000

මූලාශ්‍රය ෘ නියැදි සමීක්ෂණ දත්ත, 2023

වගු අංක 3 ෘ ප්‍රමුඛ සංරචක විශ්ලේෂණය යටතේ Varimax Factor Rotation ක්‍රමවේදයට අනුව සාධක බෙදීයාම.

සංරචක න්‍යාය				
	සංරචක			
	1	2	3	4
රුචිකත්වය (කැමැත්ත)	.065	-.104	**.829**	.017
මිතුරන්ගේ පෙළඹවීමෙන්	**.809**	-.001	.060	.200
විනෝදය / සතුටු	.199	-.089	**.597**	.166
අත්හදා බැලීම සඳහා	.035	-.001	**.766**	-.004
මානසික ගැටලු / මානසික පීඩනය	.054	.097	**.280**	-.721
අඩු අධ්‍යාපනය	**.561**	.338	.076	.078
ජීවත් වන පරිසරයේ හෝ සමාජමය බලපෑම	**.834**	-.094	.184	-.185
විරැකියා	**.810**	-.143	.086	-.156
ඥාති බලපෑමෙන්	.111	-.002	.250	**.624**
දුප්පත්කම	.005	**.932**	-.093	-.001
සමාජ මාධ්‍යය බලපෑම	-.063	**.931**	-.125	.069
පවුලේ ගැටුම්	.043	.336	.273	**.671**
අවිධිමත් රැකියාවලට යොමු වීමෙන්	**.909**	.013	.034	.073
ඉහළ ආදායම් මට්ටමක් පැවතීම	**.853**	-.003	.077	.153

මූලාශ්‍රය ෘ නියැදි සමීක්ෂණ දත්ත, 2023

PCF සාධක නිස්සාරණ ක්‍රමය යටතේ පළමු සංරචකය යටතට සාධක 6ක්, දෙවන සංරචකය යටතට සාධක 2ක්, තෙවන සංරචකය යටතට සාධක 4ක්, හතරවන සංරචකය යටතට සාධක 2ක් වශයෙන් විචල්‍යය බෙදීයාම වෙනස් වී ඇත.

රූප සටහන 1 : සාධක විශ්ලේෂණයට අනුව මත්ද්‍රව්‍යවලට ඇබ්බැහි වීමට බලපාන සාධක



මූලාශ්‍රය : නියැදි සමීක්ෂණ දත්ත, 2023

රූප සටහන 1 ට අනුව, පුද්ගලයින් මත්ද්‍රව්‍යවලට ඇබ්බැහි වීමට බලපාන සාධක ප්‍රධාන සංරචක 4කට බෙදා දක්වා ඇත. මෙහි දී බාහිර සාධකවල බලපෑම, අන්තර් පුද්ගල සාධකවල බලපෑම, මානසික සාධකවල බලපෑම, සමාජීය සාධකවල බලපෑම යන හේතු මත මත්ද්‍රව්‍යවලට ඇබ්බැහි වීමට බලපාන සාධක 4ක් දැක්විය හැක.

4. 3 මත්ද්‍රව්‍යවලට ඇබ්බැහි වීමට බලපාන ප්‍රජා විද්‍යාත්මක ලක්ෂණ සහ අනෙකුත් සමාජ ආර්ථික ලක්ෂණ අතර සම්බන්ධය අධ්‍යයනය කිරීම

මත්ද්‍රව්‍යවලට ඇබ්බැහි වීමට බලපාන ප්‍රජා විද්‍යාත්මක ලක්ෂණ සහ අනෙකුත් සමාජ ආර්ථික ලක්ෂණ අතර සම්බන්ධය හඳුනා ගැනීම සඳහා කයිවර්ග පරීක්ෂා කර සිදු කරන ලදී. පුද්ගලයින් මත්ද්‍රව්‍යවලට ඇබ්බැහි වීමට බලපාන මිතුරන්ගේ පෙළඹවීම සහ අධ්‍යාපන මට්ටම අතර කිසිදු සම්බන්ධතා නැත ($\chi^2 = 22.816,\ \mathrm{P} = 0.119$). පුද්ගලයින් මත්ද්‍රව්‍යවලට ඇබ්බැහි වීමට බලපාන මත්ද්‍රව්‍ය වර්ග සහ පවුලේ මාසික ආදායම අතර සම්බන්ධතා ඇත ($\chi^2 = 32.617,\ \mathrm{P} = 0.005$). එහි ආපතිකතා සංගුණකයේ අගය 0.5382ක් වන බැවින් මෙම විචල්‍ය දෙක අතර සම්බන්ධතාවය මධ්‍යස්ථ බව දැක්විය හැක. පුද්ගලයින් මත්ද්‍රව්‍යවලට ඇබ්බැහි වීමට බලපාන මත්ද්‍රව්‍ය වර්ග සහ පවුලේ මාසික ආදායම අතර සම්බන්ධතාවක් ඇත ($\chi^2 = 77.856,\ \mathrm{P} = 0.002$). එහි ආපතිකතා සංගුණකයේ අගය 0.7023ක් වන බැවින් මෙම විචල්‍ය දෙක අතර සම්බන්ධතාවය ප්‍රබල බව දැක්විය හැක.

පුද්ගලයින් මත්ද්‍රව්‍යවලට ඇබ්බැහි වීමට බලපාන මිතුරන්ගේ පෙළඹවීම සහ වයස අතර සම්බන්ධතා නැත ($\chi^2 = 18.472, \mathrm{P} = 0.556$). පුද්ගලයින් මත්ද්‍රව්‍යවලට ඇබ්බැහි වීමට බලපාන වයස සහ විරැකියාව අතර සම්බන්ධතා ඇත ($\chi^2 = 36.404,\ \mathrm{P} = 0.014$) එහි ආපතිකතා සංගුණකයේ අගය 0.5592ක් බැවින් මෙම විචල්‍ය දෙක අතර සම්බන්ධතාවය මධ්‍යස්ථ බව දැක්විය හැක. පුද්ගලයින් මත්ද්‍රව්‍යවලට ඇබ්බැහි වීමට බලපාන වයස සහ පවුලේ ගැටුම් අතර සම්බන්ධතා ඇත ($\chi^2 = 32.913, \mathrm{P} = 0.034$). එහි ආපතිකතා සංගුණකයේ අගය 0.5399ක් වන බැවින් මෙම විචල්‍ය දෙක අතර සම්බන්ධතාවය මධ්‍යස්ථ බව දැක්විය හැක.

පුද්ගලයින් මත්ද්‍රව්‍යවලට ඇබ්බැහි වීමට බලපාන පළමු වරට මත්ද්‍රව්‍ය භාවිතයට යොමු වූ වයස සහ අත්හදා බැලීම අතර සම්බන්ධතා ඇත ($\chi^2 = 29.593, \mathrm{P} = 0.20$). එහි ආපතිකතා සංගුණකයේ අගය 0.5196ක් වන බැවින් මෙම විචල්‍ය දෙක අතර සම්බන්ධතාවය මධ්‍යස්ථ බව දැක්විය හැක. පුද්ගලයින් මත්ද්‍රව්‍යවලට ඇබ්බැහි වීමට බලපාන පදිංචිය ස්ථානය සහ මත්ද්‍රව්‍ය භාවිතා කිරීමේ ක්‍රමය අතර ($\chi^2 = 8.356, \mathrm{P} = 0.079$) සහ පුද්ගලයින් මත්ද්‍රව්‍යවලට ඇබ්බැහි වීමට බලපාන පදිංචිය ස්ථානය සහ අවිධිමත් රැකියාවලට යොමු වීම අතර ($\chi^2 = 2.232, \mathrm{P} = 0.693$) සම්බන්ධතා නැත. පුද්ගලයින් මත්ද්‍රව්‍යවලට ඇබ්බැහි වීමට බලපාන පළමු වරට මත්ද්‍රව්‍ය භාවිතයට යොමු වූ වයස සහ මානසික ගැටලු / මානසික පීඩනය අතර සම්බන්ධතා නැත ($\chi^2 = 17.616, \mathrm{P} = 0.347$).

5. සමාලෝචනය

පුද්ගලයින් මත්ද්‍රව්‍යවලට ඇබ්බැහි වීමට බලපාන සාධක හඳුනාගැනීම සඳහා මෙම අධ්‍යයනය සිදු කරන ලදී. මෙහි අරමුණු වූයේ පුද්ගලයින් මත්ද්‍රව්‍යවලට ඇබ්බැහි වීමට බලපාන ආර්ථික සාධක, සමාජීය සාධක හා ප්‍රජා විද්‍යාත්මක සාධක අධ්‍යයනය කිරීමයි. අධ්‍යයනය තුළින් මූලිකව ගම්‍ය වූයේ ග්‍රාමීය ප්‍රදේශවලට සාපේක්ෂව නාගරික ප්‍රදේශවල මත්ද්‍රව්‍ය භාවිතයේ ව්‍යාප්තිය ඉහළ මට්ටමක පවතින බවයි. පුද්ගලයින් මත්ද්‍රව්‍යවලට ඇබ්බැහි වීමට බලපාන සාධක 14ක් හඳුනා ගනිමින් එහි බලපෑම අධ්‍යයනය කිරීම සඳහා සාධක විශ්ලේෂණය සිදු කරන ලදී. සාධක විශ්ලේෂණය තුළින් පුද්ගලයින් මත්ද්‍රව්‍යවලට ඇබ්බැහි වීමට බලපාන සාධක ලෙස සංරචක 4ක් හඳුනාගෙන ඇති අතර ඒවා නම් බාහිර සාධක, සමාජීය සාධක හා මානසික සාධක සහ අන්තර් පුද්ගල සාධක වේ.

මත්ද්‍රව්‍යවලට ඇබ්බැහි වීමට බලපාන ප්‍රජා විද්‍යාත්මක ලක්ෂණ සහ අනෙකුත් සමාජ ආර්ථික ලක්ෂණ අතර සම්බන්ධය අධ්‍යයනය කිරීම සඳහා ගොඩනඟාගත් අරමුණ විශ්ලේෂණය කිරීමට කයිවර්ග පරීක්ෂාවක් සිදු කරන ලදී. ඒ අනුව පුද්ගලයින් මත්ද්‍රව්‍යවලට ඇබ්බැහි වීමට බලපාන පවුලේ මාසික ආදායම සහ පුද්ගල කැමැත්ත යන විචල්‍යයන් අතර සම්බන්ධතාවක් ඇති බවත් , මත්ද්‍රව්‍ය වර්ග සහ පවුලේ මාසික ආදායම යන විචල්‍යයන් අතර සම්බන්ධතාවක් ඇති බවත්, වයස සහ විරැකියාව යන විචල්‍යයන් අතර සම්බන්ධතාවක් ඇති බවත්, වයස සහ පවුලේ ගැටුම් යන විචල්‍යයන් අතර සම්බන්ධතාවක් ඇති බවත්, පළමු වරට මත්ද්‍රව්‍ය භාවිතයට යොමු වූ වයස සහ අත්හදා බැලීම අතර යන විචල්‍යයන් අතර සම්බන්ධයක් ඇති බව කයි වර්ග පරීක්ෂාව මගින් සොයාගත හැකි විය.

ආශ්‍රිත ග්‍රන්ථ

අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලය (2016). මත්ද්‍රව්‍ය භාවිතයේ ව්‍යාප්තිය සහ එහි ප්‍රවණතා

Adoga, R. O. (2018). Adolescents' involvement in Drug Abuse: Causes, effects and strategies for checkmating. Retrieved from http://www.researchgate.net/publication/344395493

Azagba, S., Shan, L., Qeadan, F., & Wolfson, M. (2021). Unemployment rate, opioids misuse and other substance abuse: quasi-experimental evidence from treatment admissions data. Retrieved April 01, 2023, from http://bmcpsychiatry.biomedcentral.com/articles/

Chaman, R., Kalan, M. E., Dastoorpoor, M., Jahanbin, P., Kousari, R., Miller, R., & Musavizadeh, A. (2020). Atendency to drug addiction and

associated risk factors: A case-control study. Retrieved from http://www.primescholars.com/articles/

Dasanayake, D. (2019). Factors influencing drug addiction among the youth: Special Reference to Rehabilitation Centres and Counseling Centres Established under the National Dengerous Drug Control Board

Extension, K. P. (2023). Effect of Social Media Use on Drug Abuse among Youths in Nigeria: Implications for Youth Education. Retrieved April 06, 2023, from doi:http: //www.researchgate.net /publication /367284774

Herath, S., & Ambekar, A. (2018). Rapid Assessment of Drug Use Patterns (RADUP) among people Who Use and or Inject Drugs (PWUD/PWID) in Sri Lanka

Hilliard, J. (2019). The Influence Of Social Media On Teeh Drug Use. Retrieved May 23, 2023, from http://www.addictioncenter.com

INCB - International Narcotics Control Board.(2022). Annual Report

Jayamaha, A. R., Dharmarathna, N. D., Herath, N. D., Ranadeva, N. D., Fernando, M. M., Samarasinghe, K. L., . . . Fernando, N. (2022). The Pattern of substance Use and Characteristics of the Individuals Enrolled in Residential Treatment at Selected Rehabilitation Centers in Sri Lanka:nA Descriptive Cross-Sectional Study. Retrieved from http://www.ncbi.nlm.nih.gov/pmc/articles/PMC9130826/

Kaestner, R. (1998). does drug use cause poverty. Retrieved April 05, 2023, from http://www.nber.org/papers/w6406

Loesche, D. (2017). Infographic: Which Drugs Are Most Popular. Retrieved from http:// www.statista.com/

Mahir, I. L., & Wazeema, T. M. (2020). Social Aspects of Drug Addiction in Sri Lanka. Retrieved from http://doi.rog/10.5539/

NDDCB - National Dangerous Drugs Control Board. (2022). Handbook Of Drug Abuse information 2022

NIDA - National Institute on Drug Abuse. (2023). Retrieved March 12, 2023, from http://www.nih.gov./

Nimalaweera, B. (1970). Impact of drug abuse of youth on development (a case study in Gampaha District).Repository Home. Retrieved from http://repository.kln.ac.lk/xmlui/handle/123456789/7546

Nkonge, J. K. (2017). factors influencing drug and substance abuse among the youth in kenya. Retrieved April 03, 2023, from http://www.researchgate.net/publication/280641562

Saah, T. (2005). The evolutionary origins and significance of drug addiction - harm reduction journal. . harm reduction journal. BioMed Central. Ret. Retrieved from https://harmreductionjournal.biomedcentral.com/

Silva, V. D., & Fonseka, P. (2008). Drug addicts and their behaviour related to druge addiction among the institutionalized addicts of the Galle District. Retrieved March 12, 2023, from http://www.researchgate.net/

Sulaiman, S. N., & Zainuddin, A. (2021). Social Determinants of Drug Abuse Among Youth in Selangor: Acase Study in Serendah's Rehabilitation Centre. Retrieved March 30, 2023, from http://www.researchgate.net/publication/356648083

Tam, C. L., & Foo, Y. C. (2012). Contributory Factors of Drug Abuse and the Accessibility of Drugs. Retrieved April 01, 2023, from http://www.researchgate.net/publication/289563485

UNODC- United Nations Office in Drugs and Crimes (2022), World Drug Report

Windarwati, H., & Ati, N. A. (2021). Stress, anxiety, and depression with potential adolescent drug abuse: a cross-sectional study. Retrieved April 09, 2023, from http://www.researchgate.net /publication /34969272

Journal of Social Statistics *Page 16 - 32*
JSS (2023) Vol (10) Issue (1)

Factors Affecting to the Adoption of Online freelancing among Undergraduates

D.M.T.M.Jayasundara[1]

Abstract

In present world, the online freelancing sector has become a significant sector in the world economy and this sector has a significant impact on the Sri Lankan economy. In such a situation, this study was conducted to identify the factors affecting the adoption of online freelancing among undergraduates. Relevant primary data have been collected mainly through the questionnaire to achieve the objectives. Data collection was based on the western province state university undergraduates and 100 respondents were randomly selected for the study. Based on the results revealed by the factor analysis, trust, interpersonal behavior, and awareness can be identified as the factors affecting the adoption of online freelancing among undergraduates. According to the binary logistic regression revealed that, gender and trust have significantly contributed to the adoption of online freelancing among undergraduates. Improving online freelancing according to the factors, which were identified according to this study. Then, the adoption of online freelancing among undergraduates who follow BA degrees is increased. From that, the undergraduates could contribute to Sri Lanka's economy, and it is a solution for their unemployment. Another suggestion is creating new online freelancing websites suitable for Sri Lanka using the identified characteristics. Furthermore, long-term strategies for digital literacy development need to be focused.

Key words: Online freelancing, Undergraduates, Western province, Digital literacy

1.Introduction

The rapid increase in self-employment over the last decade has significantly altered the nature of global employment and redefined the appearance of work (Vega et al., 2021). Simultaneously, online labor platforms (OLPs) have

[1] Department of Social Statistics, University of Kelaniya
tharakajayasundara2@gmail.com

recently experienced accelerated increases in their activities (Wagner, et al., 2021). The regional distribution of transactions and task performance made possible by these platforms. They also provide employment prospects to a pool of jobs, leading to the growth of independent contractors (Mai, 2021). The OLP environment is frequently distinguished by a surplus of labor availability and jobs that are simple to execute and do not necessitate advanced or specialized skills. These characteristics make OLPs appealing to self-employed or independent workers, also known as freelancers (Baitenizov, et al., 2019). Organizations are increasingly seeking to match labor inputs more closely to commercial requirements to achieve numerical flexibility and cost savings; hiring freelancers is one means of achieving this flexibility (John, 1998).

In recent years, online freelancing marketplaces have grown rapidly. Online freelancing provides workers with the opportunity to earn money while avoiding the obligations and potential social biases associated with traditional employment frameworks (Hannak, et al., 2017). Many online freelance platforms (for example, Fiverr.com, Upwork.com, and PeoplePerHour.com) use a consistent interaction model and set of contractual terms between the client and freelancer (Ritter,2020). Prior work indicates a range of motivations and levels of offline and online freelancing engagement. In one large-scale survey, for example, 60% of freelancers said they did it by choice, while 40% said it was a necessity. Furthermore, while 50% of freelancers saw it as a temporary way to make money, an equal number saw it as a long-term career option. While online freelance domains are rapidly evolving, the Online Labor Index categorizes platform-mediated projects into six occupations: clerical and data entry, professional services, software development and technology, creative and multimedia, and sales and marketing support (Blaising, 2021)

The world is changing to digitalization, and digital technology is replacing many traditional tasks. Meanwhile, full-time work replaced by short-term or part-time work (Sorko, Rabel, & Richter, 2016). In today's changing world, individuals are increasingly turning to freelancing as an alternative to traditional employment. Aside from that, it is a solution for organizations that require part-time employees (Idrees & Junejo, 2022). According to (Burke & Cowling, 2020), freelancers are the people who contribute to the economic development of the country through entrepreneurship. Online freelancing

gives positive social-economic impact to the completely Sri Lankan people even lower income class and rural areas. Sri Lanka has the right digital infrastructure in place, online freelancing could be one of most lucrative employment generator to the country (Galpaya et al., 2017). The much-needed foreign income flowed into the country through online freelancing. Online study of freelancing reveals the estimated youth freelancers in Sri Lanka selling their skills to the world and generating revenue exceeding U$$18.7 million. Online freelancing is a good work for woman because women could work from home (Perampalam, 2020).

Work on digital labor platforms is an important source of income for many workers. Online freelancing is widely marketed by digital labor platforms as excellent income opportunities. Undeniably, well-paid jobs that can done at home in front of a computer exist. The ILO global study revealed that higher complementing pay is the main motivation for accepting tasks on online, web-based platforms (39 per cent). For instance, virtual assistants from the Philippines can earn monthly incomes ranging from US$300 to US$650.34 for many online workers. Furthermore, maintaining a flexible schedule on top of a stable monthly income allows them to accept additional freelance jobs from other clients, thus raising one’s earnings further. Most of them are just simply equipped with a good working laptop, a mobile phone and a regular internet data plan (Trajano, 2021). Freelance employment can offer a number of advantages to individuals, including flexible work arrangements, independence, variety, and some tax deductions. It can also hold some pitfalls, however, such as assuming risk in business dealings, paying self-employment taxes, and taking personal responsibility for health insurance, disability, and retirement coverage. Sri Lanka is one of the world's developing countries, with a struggling economy. Sri Lankan economic conditions are typically unstable, and unemployment is one of the country's major concerns. There are several causes of unemployment in Sri Lanka, including a lack of resources, a lack of investment, fewer opportunities, and an energy crisis. The number of unemployed people in Sri Lanka has also increased because of the negative effects of inflation (World Bank, 2022). Freelancing is one solution to the unemployment problem (Riaz, 2021). Given that freelancing, has become the primary source of employment in recent years, as well as its popularity among Sri Lanka's youth (Amitha, 2018). It is important to determine the factors, which can affect the adoption of freelancers (Ramesh et al, 2016). According

to (Le, V. S, et al., 2021), previous research limited their study to environmental factors only, but (Idrees & Junejo, 2022) have incorporated environmental factors such as digital technology support as well as personal factors such as proactive person ability and self-efficacy, both of which have an impact on freelancers. Similarly, (Blaising, 2021) investigated the impact of personal and organizational factors on freelancing. In addition, many online users today are becoming increasingly vulnerable to security threats because of their online activities (Ramesh, 2016) Security threats include risks such as information manipulation, data manipulation such as selling or modifying data, and various types of fraud and misuse to overcome this drawback it is necessary to identify the perceived security while using online freelance portal (Ramesh, 2016). According to this, it is clear that online freelancing has a huge impact on an individual's career growth. Therefore, it is important to study the factors affection to the adoption of online freelancing. Accordingly, this study identifies the determinants of the adoption of online freelancing.

2. Literature Review

Freelance work has recently drawn increased attention because of the current social and economic issues that have happened both locally and globally (Ranasinghe & Rupasingha, 2022). According to (Galpaya, Senanayake, & Perampalam, 2017) there may be 17,000 to 22,000 freelancers in Sri Lanka who are registered on various platforms and are able to sell their services anywhere in the world. Looking at some of the main web-based platforms for digital labor usage reveals that these platforms used in Sri Lanka and that several of them are among the most visited websites in Sri Lanka. Some of the well-known web-based platforms for digital labor in Sri Lanka are Fiverr.com, Freelancer.com, and Upwork.com (Galpaya, Senanayake, & Perampalam, 2017). Below figure shows the Sri Lankan's most visited freelance websites. According to Alexa, ranking Fiverr is the most renowned website used by Sri Lankan online freelancers. (See figure 1)

Figure 1: Sri Lankan's Most Visited Freelance Website



Source: Alexa ranking, (2020)

The global online worker population monitored by the Online Labor Index (OLI) 2020 has grown from 10% in 2017 to 50% in 2021. For Sri Lanka (Stephany, 2020). Freelancing hype is prominent among the youth in Sri Lanka and growing exponentially at a rate of 45% per year (Galpaya, Senanayake, & Perampalam, 2017). Around 26% of Sri Lanka's population, aged 16 to 40 are aware of online freelancing opportunities, with males being significantly more aware than females (Galpaya, Senanayake, & Perampalam, 2017).

Only 9% of those who were aware expressed an interest in working on online freelancing jobs. Willingness is among males were more amenable (11%) to such work, compared to just over half (7%) for females (Galpaya, Senanayake, & Perampalam, 2017).

Those who work part-time as freelancers earn between Rs.20,000 and Rs.30,000 per month. This amount is in addition to their salary, as the majority of them earn it while working full-time. This additional income has enabled many freelancers to improve their standard of living (Galpaya, Senanayake, & Perampalam, 2017).

Table 1: Freelancers Income in 2016

Comparison	Revenue per year (millions)	Employees	Per employee contribution	Nature of work
BPO Industry	$850	80,000	$10625	Full time
Freelancing	$18.7	7800	$2400	Majority part-time

Source: SLASSCOM Strategy document, (2016)

According to table 1 in 2016, the average employee contribution to online freelancing was USD 2,400, while the BPO industry averaged $10,625. Because most online freelancers in Sri Lanka work part-time, this industry has enormous growth potential in Sri Lanka (SLASSCOM Strategy document 2016).

3. Methodology

3.1 Population and Sample

The study concentrates on undergraduates in the western province of Sri Lanka. The sample was selected using a simple random sampling method.

Table 2: undergraduate enrolments in western province BA degrees

Type	Name	Enrollments for BA degrees
University	University of Colombo	3482
	University of Sri Jayawardhanapura	3538
	University of Kelaniya	5905
	University of Visual and performing Arts	2576

Source: University grants commission, 2021

The total population for this study is 15501 undergraduates which include government universities undergraduates who followed a BA degree in the academic year 2019/2020.(See table 2).

3.1.1 Sampling Design

The "Yamane'' method is used to calculate the sample size for this study. "Many researchers commonly add 10% to the sample size to compensate for persons that the researcher is unable to contact" (Israel,1992). Thus sample size was selected according to the 90% (0.1) confident level as follows.

$$n = \frac{N}{1+Ne^2}$$

$$n = \frac{15501}{1+15501 \times 0.1^2}$$

$$n = 99.5 \cong 100$$

- Non-responsive rate
  5% or 10% can be used to reduce the problem of non-responders to the study (Lindner, Murphy & Briers, 2001). There for this study use the 5% (0.05) level.

$$\text{Final n} = \frac{number\ of\ sample\ needed}{1 - expected\ precentage\ of\ non\ responsive\ rate}$$

$$= \frac{100}{1-0.05}$$

$$= 105.26 \cong 105$$

Accordingly, 104 undergraduates from the population will be selected for the sample.

3.1.2 Method of Data Collection

There are two main ways which data can be collected for this study. They are primary data and secondary data. Primary data is the data that is collected for the first time via q via questionnaire. Data gathered from journals and books as secondary data.

4. Results and Discussion

ජනසංඛ්‍යාව වයස්ගත වීමේ ක්‍රියාවලිය ජනසංඛ්‍යා වර්ධනය අත්‍යන්ත ප්‍රතිඵලයයි. එනම් ජන සංඛ්‍යාව වයස්ගත වීම, සාඵල්‍යතාවය පහළ යාම හා මර්ථතා මට්ටම හේතුවෙන් ඇතිවන ප්‍රජා විද්‍යාත්මක සංක්‍රාන්තියේ අත්‍යන්තයයි. ඒ අනුව වර්තමානය වන විට ශ්‍රී ලංකාවම සුවිශේෂී සන්ධිස්ථානයකට පිවිස සිටින බව පෙනේ. මෙම තත්ත්වය හේතුවෙන් ශ්‍රී ලංකාව සංවර්ධිත රටවල් හා සම මට්ටමකට ළඟා වී ඇත. එසේම ශ්‍රී ලංකාව ප්‍රජා විද්‍යාත්මක වශයෙන් වර්තමානය වන විට ජනසංඛ්‍යාව වයස්ගත වීම, ශ්‍රම බලකායට දැඩි ලෙස බලපෑමක් එල්ල කර ඇත. එම නිසා වර්තමානයේ බොහොමයක් වයස්ගතවූවන් රැකියාවල නිරත වීමේ ප්‍රවණතාවක් දක්නට ලැබේ. එසේ වයස්ගතවූවන් රැකියාවල නිරත වීම සඳහා විවිධ හේතු සාධක පවතී. මෙහි ප්‍රධාන අරමුණ වන්නේ වයස්ගත ජනගහනය ශ්‍රම සහභාගිත්වය සඳහා බලපාන හේතු සාධක අධ්‍යයනය කිරීමයි. ශ්‍රම සහභාගීත්වය සඳහා ප්‍රජා විද්‍යාත්මක සාධකවල බලපෑමත්, ආර්ථික හා සමාජීය සාධකවල බලපෑමත් අධ්‍යයනය කිරීම සෙසු අරමුණු වේ. මෙම අධ්‍යයනය ශ්‍රී ලංකාවේ වැඩිම වයස්ගත ජනගහනයක් සහ වැඩිම ශ්‍රම සහභාගිත්වය දක්වන කොළඹ දිස්ත්‍රික්කයේ තිඹිරිගස්යාය ප්‍රාදේශිය ලේකම් කොට්ඨාසයට අයත් හැව්ලොක්, කිරුළපණ, දෙමටගොඩ යන ග්‍රාම නිලධාරි වසමවලින් 100 ක නියැදියක් සරල සසම්භාවී නියැදුම් ක්‍රමය මගින් තෝරා ගන්නා ලදී. .ඒ සඳහා ප්‍රශ්නාවලි ක්‍රමය යොදාගෙන දත්ත රැස් කර ගන්නා ලදී. දත්ත විශ්ලේෂණය සඳහා විස්තරාත්මක සංඛ්‍යානය, කයි වර්ග පරීක්ෂාව, සාධක විශ්ලේෂණය යන දත්ත විශ්ලේෂණ ක්‍රම යොදා ගන්නා ලදී. වයස්ගතවූවන්ගේ ශ්‍රම සහභාගිත්වය සඳහා බලපාන ආර්ථික සාධකත්, පවුල් පසුබිම ආශ්‍රිත සාධකත් , සමාජීය සාධකත් හඳුනා ගන්නා ලදී. මෙහිදී වයස්ගතවූවන්ගේ ශ්‍රම සහභාගීත්වය සඳහා ප්‍රබල ලෙස බලපා ඇත්තේ පවුල් පරිසරය ආශ්‍රිත හේතු සාධකයි. ඊට අමතරව ආර්ථික හා සමාජීය සාධක මධ්‍යස්ථව බලපා ඇත. වයස්ගත වූවන්ගෙන් ආර්ථිකයට වන බලපෑම අවම කර ගැනීම සඳහා වැඩි ප්‍රතිශතයක් රැකියාවල නිරත කර ගැනීම සඳහා ආකර්ශනීය වැටුප් , දීමනා ලබා දී සේවක අභිප්‍රේරණය ඇති කිරීමට කටයුතු කළ යුතුය. එසේම ඔවුන්ගේ සේවා කාලය දීර්ඝ කර ගැනීම සඳහා ආයතනික වශයෙන් පියවර ගැනීමට කටයුතු කළ යුතුය.

මුඛ්‍ය පද : වයස්ගත ජනගහනය , ප්‍රජා විද්‍යාත්මක , සාඵල්‍යතාව, ශ්‍රම සහභාගිත්ව

---

[1] *සමාජ සංඛ්‍යාන අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය*
charithasandamali0821@gmail.com

1. හැඳින්වීම

ජනගහනය වයස්ගත වීම ජන විකාශන සංක්‍රාන්තියක නොවැළැක්විය හැකි ප්‍රතිඵලයකි. වයස් ව්‍යුහය වර්ගීකරණය කිරීමේදී ළමා, තරුණ හා වයස්ගත වශයෙන් ප්‍රධාන කාණ්ඩ තුනකට බෙදා දැක්විය හැකිය. වයස්ගත ජනගහනය පිළිබඳ නිර්වචනය රටින් රටට වෙනස් වුවත් අවුරුදු 60 සහ ඊට වැඩි වයස් කාණ්ඩයේ ජනගහන ප්‍රතිශතය වැඩි වෙමින් ඇති විටෙක ජනගහනය වයස්ගත වන බව ප්‍රකාශ කෙරේ. එසේම අවුරුදු 60 - 74 දක්වා වූ ජනගහනය තරුණ වයස්ගත ජනගහනය ලෙසත්, වයස අවුරුදු 75ට වැඩි ජනගහනය වයෝවෘද්ධ ජනගහනය ලෙසත් නිර්වචනය කරනු ලැබේ (Myers ,1985).

සංවර්ධනය වන රටක් වශයෙන් ශ්‍රී ලංකාවේ ජන විද්‍යාත්මක තත්ත්වය පැතිගණනාවක් සුවිශේෂී ලක්ෂණ පෙන්නුම් කරයි. දීර්ඝකාලීන වශයෙන් වූ ශ්‍රී ලාංකාවේ මානව සුබසාධනය අරමුණු කරගත් සංවර්ධන ක්‍රියාවලියේ ප්‍රතිඵලයක් වශයෙන් අනෙකුත් කලාපීය රටවලට වඩා ශ්‍රී ලංකික ජනතාවගේ ආයු අපේක්ෂාව පසුගිය කාල පරිච්ඡෙදයේ දී සැලකිය යුතු මට්ටමක් ඉහළ ගොස් තිබේ. 2012 වසර වන විට ශ්‍රී ලංකාවේ උපතේදී තිබූ අපේක්ෂිත ආයු කාලය අවුරුදු 75.7% ක් වූ අතර 2020 වන විට අවුරුදු 77.06% තරම් ඉහළ මට්ටමක පැවතුණි. සාර්ක් රටවල උපතේදී ජීවිත ආයු අපේක්ෂාව පිළිබඳව සලකා බැලීමේදී ඉහළම ජීවිත අපේක්ෂාව වූ අවුරුදු 80.11 ක් ශ්‍රී ලංකාවේ ස්ත්‍රීන්ගෙන් වාර්තා වන අතර, පුරුෂ ජීවිත අපේක්ෂාව සම්බන්ධයෙන් ද ශ්‍රී ලංකාවේ ඉහළම ස්ථානයක් පෙන්වා ඇත. එය අවුරුදු 72 කි (චන්ද්‍රකාන්ති,2011).

මෙලෙස ශ්‍රී ලංකාවේ ජීවිත අපේක්ෂාව වැඩිවීම තියුණු ලෙස ජනසංඛ්‍යාවේ වර්ධනය, ප්‍රමාණය සහ එහි වයස් ව්‍යුහය කෙරෙහි බලපෑම් ඇති කිරීමට සමත් වී ඇත. ජීවිත අපේක්ෂාව වැඩිවීම උපත් අනුපාතිකය අඩු වීමට සහ වයස්ගත ජන සංඛ්‍යාව වැඩිවීමට ඍජු ලෙසම බලපා ඇති අතර මෙම ප්‍රවණතාවයන් අනාගත ජන සංඛ්‍යාව කෙරෙහි ද නිරතුරුවම බලපෑම් ඇතිකරනු ලබයි. ශ්‍රී ලංකාවේ 1991 වසරේ අවුරුදු 60 හා වැඩි ජනසංඛ්‍යාවේ ප්‍රතිශතය 8.1% ක් වූ අතර 2001 වසරේ දී එය 9.2% ක් දක්වා වර්ධනය වී ඇත. 2012 වසරේදී එය 12.5% ක් දක්වා වර්ධනය වී ඇති බව පැහැදිලි වෙයි. 2041 වන විට මෙම පිරිස 27.8% ක් දක්වා වර්ධනය වන බව ප්‍රක්ෂේපනය කර ඇත. මෙම තත්ත්වය සාඵල්‍යතාවය, මර්ථතාවය හා ජාත්‍යන්තර සංක්‍රමණ යන උපනතීන් සියල්ලෝම එකතු වන ප්‍රතිඵලයක් ලෙස දැක්විය හැකිය (චන්ද්‍රකාන්ති,2011).

එක්සත් ජාතීන්ගේ සංවිධානයට අනුව 1995 වසරේ ආසියාවේ ජීවත් වූ වයස අවුරුදු 60 හෝ ඊට වැඩි ජනගහනයේ ප්‍රතිශතය 8.2% කි. මෙය වසර 2000 වන විට 12.6% ක් පමණ වී ඇත. දකුණු ආසියාවේ අනෙකුත් රටවල් හා සැසඳීමේ දී ලංකාවේ වයස ජනගහනයේ සමානුපාතයට වඩා ඉහළ මට්ටමක පවතී. 1975 දී අප රටේ අවු 60 න් හෝ ඊට වැඩි ජනගහනයේ ප්‍රතිශතය 6.3% ක් වූ අතර 2000 වන විට එය

9.3% ක් දක්වා වර්ධනය විය. මෙම අගය 2031 වන විට 22% ක් පමණ දක්වා ඉහළ යන බව ප්‍රක්ෂේපිත දත්තයන්ගෙන් පෙන්නුම් කරයි (United Nations, 1999).

මෙලෙස සීඝ්‍ර ලෙස ඉහළ යන වයස්ගත ජන සංඛ්‍යාව ශ්‍රී ලංකාවේ මෑත කාලීන සමාජ, ආර්ථික හා දේශපාලන වෙනස්කම් සමග වයස්ගතවූවන්ට ආධාරක වීමෙහි ලා පවුල සතුව ඇති හැකියාව ක්‍රමයෙන් අඩුවෙමින් පවතී. එසේම ශ්‍රී ලංකාවේ ආර්ථික සංවර්ධනයේ මන්දගාමී ස්වභාවය තුළ වයස්ගත වූවන්ට ආර්ථික හා සමාජයීය රැකවරණය සැපයීම සම්බන්ධයෙන් රජයට වඩා වැඩි වගකීමක් දැරීමට පවුල් ඒකකයට සිදුවී තිබේ. එහෙත් දියුණු රටවල පවත්නා සංවර්ධන මට්ටම අනුව සහ එම රටවල වයස්ගත ජනසංඛ්‍යාවට සලසා ඇති රක්ෂණ ආවරණ සහ අනිකුත් ආරක්ෂිත ක්‍රම හේතුවෙන් වයස්ගතවූවන්ගෙන් පවුලටත්, ආර්ථිකයටත් ඇතිකළ බලපෑම සෘණාත්මකය (චන්ද්‍රකාන්ති,2011). අනෙක් අතට ඔවුන්ගේ විශ්‍රාම වැටුප් ඇතුළු වෙනත් ජීවනාධාර, සෞඛ්‍ය පහසුකම් මහලු නිවාස වැනි දෑ සඳහා රජයේ සුබසාධන වියදම් වැඩි කිරීමට සිදු වේ. අනාගතයේ ශ්‍රමිකයින් වීමට සිටින ළමා හා තරුණ ජනගහනයේ කායික සහ මානසික හැකියාවන් වර්ධනය කිරීමෙහිලා ආයෝජනය කළ යුතු ධනයෙන් විශාල කොටසක් මෙසේ ශ්‍රම හමුදාවෙන් ඉවතට හා වයස්ගත ජන කොට්ඨාසය වෙනුවෙන් වෙන් කිරිමට සිදුවීම සංවර්ධනය රටක් වන ශ්‍රී ලංකාව තුළ විවිධාකාර ආර්ථික හා සාමාජික ගැටලු උද්ගත කිරීමට හේතු වේ (පතිරණ,2010). එම නිසා වර්තමානය වනවිට බොහෝමයක් වයස්ගතවූවන් විශ්‍රාම වයසෙන් ඔබ්බට රැකියාවල නිරත වීමේ ප්‍රවණතාව අද වන විට වැඩි වී තිබේ. සමස්තයක් ලෙස ගත් විට ශ්‍රී ලංකාවේ වයස්ගත ජනගහනයේ ශ්‍රම දායකත්වය සඳහා බලපාන හේතු සාධක හඳුනා ගැනීම මෙම අධ්‍යයනයේ ප්‍රධාන අරමුණ වේ.

2. සාහිත්‍යය විමර්ශනය

ලෝකයේ ජනසංඛ්‍යාව ශීඝ්‍රයෙන් වර්ධනය වෙමින් පවතී. වර්තමානයේදී ලොව ඇතැම් රටවලට ජනසංඛ්‍යාව ශීඝ්‍රයෙන් වර්ධනය වීම ගැටලුවකි. විශේෂයෙන් සංවර්ධනය වෙමින් පවතින රටවල ජනසංඛ්‍යා වර්ධනය සංවර්ධිත රටවලට සාපේක්ෂව වේගවත් ව සිදු වේ. එබැවින් ඕනෑම රටක සංවර්ධන ක්‍රියාවලිය තුළ ජනසංඛ්‍යාව ප්‍රශස්ත මට්ටමක පවත්වා ගැනීම ඉතා වැදගත් වේ. දැනට අවුරුදු 200 කට පෙර ලෝක ජනගහනය ඉතා කුඩා ප්‍රමාණයක් විය. සෑම වසරකම ළදරුවන් මිලියන 140 ක් පමණ උපදින අතර වර්තමානය වන විට ලෝක ජනසංඛ්‍යාව බිලියන 8 ඉක්මවා ඇත. එමෙන්ම 2030 වන විට ගෝලීය ජනගහනය 8.5 දක්වාත් , 2050 වන විට 9.7 දක්වාත් ,2080 වන විට බිලියන 10.4 දක්වාත් ළඟා වනු ඇතැයි පුරෝකථනය කර ඇත. (World population prospects, 2022).

ජනගහනය වයස්ගත වීම, යනු සමස්ත ජනගහනයෙන් සමානුපාතිකව වැඩි කොටසක් වැඩිහිටි පුද්ගලයින් විසින් දරන ක්‍රියාවලියයි. එය සමහර විට ,ජනගහන වයස්ගත වීම, හෝ ,ගෝලීය වයස්ගත වීම, ලෙස හැඳින්වේ. ආයු අපේක්ෂාව වැඩිවීම පැහැදිලිවම මහජන සෞඛ්‍ය සහ වෛද්‍ය විද්‍යාව වැඩිදියුණු කිරීමේ සාර්ථක ප්‍රතිඵලයකි (Anderson , 2017).

බටහිර රටවල පොදු වශයෙන් වයසකවූවන් ලෙස සලකන්නේ වයස අවුරුදු 65 සහ ඊට වැඩි පිරිස වන අතර සංවර්ධනය වෙමින් පවතින බොහෝ රටවල වයස අවුරුදු 60 සහ ඊට වැඩි පිරිස වයස්ගත ජනගහනය ලෙස සැලකේ (Myers, 1985).

වියපත් ජන සංඛ්‍යාව ගෝලීය වශයෙන් හඳුනාගත හැකි ප්‍රධාන ප්‍රපංචයකි. මානව ශිෂ්ටාචාරයේ ආරම්භක අවස්ථාවේ දී ජනසංඛ්‍යාව සීමිත වූ අතර පරිසරයට අනුකූලව තම දිවි පැවැත්ම සකස් කරගෙන සිටින ලදී. මෙම අවධිය වන විට ඉහළ සහ සාඵලයතාවක් මෙන්ම මර්ථතාවය වාර්තා විය. කාර්මික විප්ලවයේ මානව ඉතිහාසයේ හැරවුම් ලක්ෂයක් වශයෙන් සඳහන් කළ හැකි අද එම අවධියේදී සෞඛ්‍යමත් ජීවිතයක් සඳහා අවශ්‍ය ද්‍රව්‍ය නිෂ්පාදනය ආරම්භ වීමත් සමඟම මරණ සංඛ්‍යාව ක්‍රමයෙන් අඩු වන්නට වූ අතර සාඵල්‍යතාව ඉහළ යාම නිසා ජනසංඛ්‍යාවේ ස්වභාවික වර්ධන වේගය ගෝලීය මට්ටමින් නිර්මාණය වන්නට විය (Tomassini,2004).

ජනසංඛ්‍යාව වයස්ගත වීම සහ මහළු යැපුම් අනුපාතය ඉහළ යාම සම්බන්ධ ගැටලුවලට මෙතෙක් කලක් මුහුණ දෙමින් සිටියේ සංවර්ධිත රටවල් පමණි. නමුත් මෙම සියවස ආරම්භ වන විට සංවර්ධනය වන රටවල් තුළ ද මෙම ගැටලුව නිර්මාණය වෙමින් පවතී ලෝකයේ සංවර්ධිත රටවල් සිය අවුරුදු 65ට වැඩි ජන කොට්ඨාසය වර්ධනය වීමේ ක්‍රියාදාමයට ආපසු හැරවිය නොහැකි සේ අවතීර්ණ වී ඇත. ජපානය වැනි රටවල් දැනටමත් වයස්ගත ජන ස්ථීරය රටේ මුළු ජනසංඛ්‍යාවෙන් 20% ක් දක්වා වර්ධනය කර ඇත. ජර්මනිය, ග්‍රීසිය, ඉතාලිය සහ ස්පාඤ්ඤය වැනි රටවල අවුරුදු 60ට වැඩි ජන සංඛ්‍යාව අවුරුදු 20ට වැඩි ජන සංඛ්‍යාවට වඩා විශාල වන අතර ඉතා දැඩි ලෙස දැනට වර්ධනය වෙමින් පවතින ජනගහන විද්‍යාත්මක විප්ලවය ඉන් පැහැදිලි වේ (එක්සත් ජාතීන්ගේ වාර්ෂික වාර්තාව, 2000).

සමස්ත ආසියාවෙන් ම නැගෙනහිර ආසියාවේ ජනසංඛ්‍යාව වයස්ගත වීමේ ප්‍රවණතාව අතින් ඉදිරියෙන් පසුවේ. එසේ වුවත් අග්නි දිග ආසියාවේ සිංගප්පූරුව වැනි රටවල් හා දකුණු ආසියාවේ ශ්‍රී ලංකා වැනි රටවල් ද මෙම මට්ටමේ පසුවේ. ශ්‍රී ලංකාවේ වැඩිහිටි ජනගහනය දැනට සමස්තයෙන් 12.4% ක් නියෝජනය කරයි. ශ්‍රී ලංකාව යනු ශීඝ්‍රයෙන් වයස්ගතවන ජනගහනයක් සිටින ලෝකයේ එක් රටකි. 1953 දී ශ්‍රී ලංකා වැඩිහිටි ජනගහනය 5.4% ක් වූ අතර 2003 දී එය මුළු ජනගහනයෙන් 10.8%විය. 1953 සිට 2003 දක්වා වසර පනහක කාලය තුළ එය විශාලත්වයෙන් දෙගුණයක් පමණ වී ඇත. 1981 සහ 2012 දී වැඩිහිටි ජනගහනය පිළිවෙලින් 6.6% සහ 12.4% ක් විය. වසර 2041 වනවිට ශ්‍රී ලාංකිකයින් හතර දෙනෙකුගෙන් එක් අයෙකු වයස් ගත වනු ඇත ඇතැයි ගණන් බලා ඇත (Maduwage, 2019).

ජන සංඛ්‍යාව වයස්ගත වීමේ ක්‍රියාවලියත් සමගම වයස්ගත වීම ආශ්‍රිත ගැටලු රාශියකට මුහුණ දීමට සිදුවී ඇත. ජනගහනය වයස්ගතවීම සංවර්ධනය වෙමින් පවතින රටවලට එක් ආකාරයකටත් සංවර්ධිත රටවලට තවත් ආකාරයකටත්

බලපෑම් කරනු ලැබේ. මෙසේ ජනගහනය හොයා ගත වීමේ ප්‍රතිඵලයක් වශයෙන් මතු වී ඇති වැදගත් ගැටලුවක් වන්නේ වයස්ගත පුද්ගලයින් උදෙසා ආර්ථික හා සමාජයීය ආධාර කොතෙක් දුරට සාර්ථකව සැපයිය හැකි ද යන්නයි (ලක්මාලි,2016).

ලෝකයේ ශ්‍රම බලකාය වයස අවුරුදු 60 හෝ ඊට වැඩි වැඩිහිටි ශ්‍රමිකයන්ගේ කොටස 1990 දී 10.5 ද 2014 වන විට 14.3 ක් දක්වා පුළුල් විය. Ekkehard පවසා සිටින්නේ 2030 වන විට ශ්‍රම බලකායේ සිටින වැඩිහිටි කම්කරුවන් සංඛ්‍යාව මිලියන 270 ක් දක්වා වැඩි වීමට ඉඩ ඇති බවයි.

ශ්‍රී ලංකාවේ ආර්ථික වශයෙන් වයස්ගත ජනගහනය සඳහා පුළුල් සමාජ ආරක්ෂණ යාන්ත්‍රණයක් නොමැත. 2012 නිවාස හා ජනසංගණනයට අනුව වයස 60 වැඩි සහ රැකියා කරන ලද පුද්ගලයින් සංඛ්‍යාව 644 347 ක් විය. එනම් සෑම වැඩිහිටියන් හතර දෙනෙකුගෙන් එක් අයෙකු සේවය කරති. එමෙන්ම වැඩිහිටි පිරිමින්ගේ 43% පමණ සේවයේ යෙදී සිටින අතර කාන්තාවන්ගෙන් 11% ක් පමණ පිරිසක් සේවයේ යෙදී ඇත (Ageing Population Of Sri Lanka, 2012).

තරුණ වැඩිහිටි කාණ්ඩයේ සිටි වැඩිහිටි පුද්ගලයින් රැකියාවට නැඹුරුවන අතර මැදි මහලු සහ වැඩිහිටි මහලු විය පිළවෙලින් 15% සහ 8% පමණ වන රැකියා කිරීමට ඇති ඉඩකඩ අඩුය. සේවා නියුක්ත ඇති වැඩිහිටි පිරිසගෙන් අඩකට වඩා වැඩි පිරිසක් කෘෂිකාර්මික ,වන වගාව සහ ධීවර කර්මාන්තයේ (31.4%) සහ ප්‍රාථමික රැකියාවල (23.1%) නියැලී ඇත.කාන්තාවන්ගෙන් සැලකිය යුතු කොටසක් අවිධිමත් අංශයේ රැකියාවල නියැලී සිටිති (Ageing Population Of Sri Lanka, 2012).

Lam et al (2006) ට අනුව වැඩිහිටි අය අතර රැකියා අනුපාතය ඉහළය. විශ්‍රාම වැටුපක් නොලබන සහ අප්‍රිකාවේ වඩාත්ම ආර්ථිකමය වශයෙන් ක්‍රියාකාරි වැඩිහිටි ජනගහනය සිටින බව සලකන විට, එයින් ඇඟවෙන්නේ ඔවුන් සහභාගී වීමට වැඩි ඉඩක් පවතින බවයි.

3. අධ්‍යයන ක්‍රමවේදය

මෙම අධ්‍යයනය සඳහා ප්‍රාථමික දත්ත හා ද්විතීයික දත්ත යන දෙවර්ගයේම දත්ත රැස් කරන ලදී. ප්‍රාථමික දත්ත ලබාගැනීම සඳහා මූලිකවම ප්‍රශ්නාවලි ක්‍රමය භාවිතා කරන ලදී. එසේම අවශ්‍ය ද්විතීයික දත්ත මාතෘකාවට අදාළව සිදු කරන ලද පර්යේෂණ, ප්‍රකාශිත වාර ප්‍රකාශන හා සඟරා මගින් ලබා ගැනීමට කටයුතු කරන ලදී.

මෙම අධ්‍යයනයට අදාළව ප්‍රාථමික දත්ත රැස් කර ගැනීම සඳහා අදාළ ප්‍රශ්නාවලිය කොටස් දෙකකින් සමන්විත වන ආකාරයට සකස් කරන ලදී. මෙම පර්යේෂණය තුළදී දත්ත දායකයා ලෙස හඳුනා ගනු ලැබූ අවුරුදු 60ට වැඩි වයස්ගත වූවන්ගේන් විමසා ලබාගන්නා පිළිතුරු සටහන් කරගැනීම විමර්ශකයා විසින්ම සිදු කරන ලදී.මෙලෙස ප්‍රාථමික දත්ත රැස් කර ගැනීම සඳහා සම්මුඛ සාකච්ඡා ක්‍රමය ද යොදා ගන්නා ලදී. ඒ අනුව සකස් කරන ලද ප්‍රශ්ණාවලියේ යෝග්‍යතාව, ගුණාත්මකභාවය,

නිවැරදි භාවය, ප්‍රමාණවත් බව සහ කාර්යක්ෂමතාවය පිළිබඳව සලකා බැලීම සඳහා පූර්ව පරීක්ෂාවක් සහ නියාමක පරීක්ෂාවක් ද සිදු කරන ලදී.මෙහිදී ප්‍රතිචාරකයන් කිහිප දෙනෙකුගේන් ප්‍රාථමික දත්ත ලබාගෙන ඉන් පසුව ප්‍රශ්නාවලියේ අඩුපාඩු නැවත සකස්කර පසුව අධ්‍යයනය සඳහා අවශ්‍ය දත්ත ලබාගැනීම සිදුකරන ලදී. ශ්‍රී ලංකාවේ සිටින වයස්ගත ජනගහනයෙන් වැඩිම පිරිසක් සිටින්නේ කොළඹ දිස්ත්‍රික්කය තුළයි. දිස්ත්‍රික්කය තුළ පවතින ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස අතුරින් තිඹිරිගස්යාය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ සිටින අවුරුදු 60ට වැඩි පිරිස ඉහළ මට්ටමක පවතින නිසා අධ්‍යයන සංගහනය ලෙස තිඹිරිගස්යාය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තෝරා ගත හැකි විය. නියැදිය වශයෙන් තිඹිරිගස්යාය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ හැව්ලොක්, දෙමටගොඩ, කිරුළපන යන ග්‍රාම නිලධාරී වසම් තුනෙන් සිය දෙනකු පමණක් තෝරා ගත හැකි විය.

ජන ලේඛන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව මගින් ශ්‍රී ලංකාවේ ශ්‍රම බලකාය පිළිබඳව කරනු ලබන සමීක්ෂණ වාර්තාව (2019) මගින් ශ්‍රී ලංකාවේ සිටින වයස්ගත ජනගහනයේ ප්‍රමාණයද, ශ්‍රම දායකත්වය ලබා දෙන වයස්ගත ජනගහනයේ ප්‍රමාණයද විවිධ සඟරා, පොත්, විවිධ සමීක්ෂණ, අන්තර්ජාල වාර්තා සහ විමර්ශන ග්‍රන්ථ තුළින් අධ්‍යයනය ආරම්භයේ සිටම සෑම පරිච්ඡේදයක් තුළදීම තොරතුරු ලබාගන්නා ලදී.

වයස්ගත ජනගහනයේ ශ්‍රම සහභාගිත්වය සඳහා බලපාන හේතු සාධකයන් පිළිබඳව ප්‍රධාන සංරචක විශ්ලේශණය සිදුකරන ලදී. සාධක විශ්ලේෂණය යනු නිරීක්ෂණය කරන ලද සහසම්බන්ධිත විචල්‍යයන් අතර විචලතාවයන් විස්තර කිරීම සඳහා භාවිතා කරන සංඛ්‍යානමය ක්‍රමයකි. උදාහරණ ලෙස සහසම්බන්ධතා න්‍යාසයෙහි ඉහළ සහසම්බන්ධතා සංගුණකය හා පහළ සහසම්බන්ධතා සංගුණකය පවතින විට ඒ අනුව සාධක වර්ගීකරණය කළ හැක. මෙහිදී සාධක විශ්ලේෂණය ඔස්සේ ශ්‍රී ලංකාවේ වයස්ගත ජනගහනයේ ශ්‍රම සහභාගිත්වය සඳහා බලපාන හේතු සාධක අතුරින් ප්‍රබලතම සාධක හඳුනා ගැනීම සිදුකරනු ලැබේ.

සාධක විශ්ලේෂණය තුළ සාධක විශ්ලේෂණය සිදු කරනු ලබයි. ඒ අනුව සංඛ්‍යාතය, මධ්‍යන්‍යය හා සම්මත අපගමනය ගණනය කරනු ලබයි. එමෙන්ම මෙහිදී සහසම්බන්ධතා න්‍යාසය මගින් විචල්‍යයන්ගේ සංගුණකයන් හා වෙසෙසියා මට්ටම් දක්වනු ලබයි. සාධක විශ්ලේෂණයේදී KMO පරීක්ෂාව (Kaiser Meyer Olkin) සහ Bartlett's පරීක්ෂාව මගින් නියැදියේ Sphericity පරීක්ෂා කරනු ලබයි.

4. දත්ත විශ්ලේෂණය හා අර්ථකථනය

4.1 වයස්ගත ජනගහනයේ ශ්‍රම සහභාගිත්වය සඳහා බලපාන හේතු සාධක අධ්‍යයනය සඳහා කයි වර්ග පරීක්ෂාව

අධ්‍යයනයට අනුව පරීක්ෂා කරන ලද කයිවර්ග පරීක්ෂාවල කල්පිතයන් පිළිගන්නේද ප්‍රතික්ෂේප කරන්නේ ද යන්න මෙහිදී පරීක්ෂා කරන ලදී. වයස්ගත ජනගහනයේ

ශ්‍රම සහභාගිත්වය සඳහා ප්‍රජා විද්‍යාත්මක සාධකවල බලපෑමක් තිබේ ද නොතිබේ ද යන්න අධ්‍යයනය කිරීම මෙම පර්යේෂණයේ අරමුණ වේ.

වගු අංක 1 ඃ වයස්ගත ජනගහනයේ ශ්‍රම සහභාගිත්වය සඳහා බලපාන හේතු සාධක අධ්‍යයනය සඳහා කයි වර්ග පරික්ෂාව

කල්පිතය	Df	$\chi 2$	P value	C value
H0: වයස්ගත ජනගහනයේ ශ්‍රම සහභාගිත්වය කෙරෙහි ස්ත්‍රී -පුරුෂභාවය බලපාන ආකාරය පිළිබඳ ස්වායත්තතාව පරික්ෂා කිරීම.	2	7.911[a]	0.000	0.2708
H0:වයස්ගත ජනගහනයේ ශ්‍රම සහභාගිත්වය කෙරෙහි වයස බලපාන ආකාරය පිළිබඳ ස්වායත්තතාව පරික්ෂා කිරීම.	4	180.788[a]	0.000	0.8024
H0 : වයස්ගත ජනගහනයේ ශ්‍රම සහභාගිත්වය කෙරෙහි අධ්‍යාපනය බලපාන ආකාරය පිළිබඳ ස්වායත්තතාව පරික්ෂා කිරීම.	12	36.863[a]	0.000	0.5189
H0: වයස්ගත ජනගහනයේ ශ්‍රම සහභාගිත්වය කෙරෙහි විවාහකත්වය බලපාන ආකාරය පිළිබඳ ස්වායත්තතාව පරික්ෂා කිරීම.	8	18.310[a]	0.019	0.3933

මූලාශ්‍රය ඃ නියැදි සමීක්ෂණ දත්ත , 2023

වයස්ගත ජනගහනයේ ශ්‍රම සහභාගිත්වය කෙරෙහි ස්ත්‍රී -පුරුෂභාවය, අධ්‍යාපනය, විවාහකත්වය සහ වයස බලපාන ආකාරය පිළිබඳ ස්වායත්තතාව පරික්ෂා කිරීමේදී එම විචල්‍යය අතර සම්බන්ධතාවයක් ඇති බව පෙන්නුම් කර ඇත.

4.2 වයස්ගත ජනගහනයේ ශ්‍රම සහභාගීත්වය සඳහා බලපාන සාධක හඳුනා ගැනීම

විචලතා ආකෘතියක් විස්තර කළ හැකි වඩාත් හොඳම රේඛීය සම්බන්ධතා කාණ්ඩය තෝරා ගැනීම සඳහා ප්‍රධාන සංරචක විශ්ලේෂණය සිදු කරයි. ඒ අනුව මෙහිදී වයස්ගත ජනගහනයේ ශ්‍රම සහභාගිත්වය කෙරෙහි බලපානු ලබන සාධක පිළිබඳව විශ්ලේෂණය කිරීම සඳහා සාධක 10 ක් පිළිබඳ රැස් කරගත් දත්තවල ප්‍රධාන සංරචක විශ්ලේෂණය සිදු කොට ඇත.

X1	විවාහ නොවී සිටීම නිසා
X2	දෛනික ජීවිකාව කරගෙන යෑම සඳහා
X3	කායික මානසික තෘප්තිය උදෙසා
X4	විශ්‍රාම වැටුප් ප්‍රමාණවත් නොවීම නිසා
X5	ඉතුරු කිරීම් සඳහා
X6	ඵක බලා ගැනීම කෙනෙක් නොමැති නිසා
X7	සෞඛ්‍යය වියදම් ඉහළ යාම නිසා
X8	ගෘහ මූලික තනතුරු දැරීම නිසා
X9	සමාජ තත්වය ඵක ගැනීම සඳහා
X10	ඵකියා පුරප්පාඩු පිරවීම සඳහා

වගු අංක 2 : KMO සහ Bartlett’s පරික්ෂාව

Kaiser-Meyer-Olkin Measure of Sampling Adequacy**.** Bartlett's Test of Sphericity Approx. Chi-Square df Sig.	0.777 485.339 45 0.000

මූලාශ්‍රය : නියැදි සමීක්ෂණ දත්ත , 2023

සාධක න්‍යාසය ආශ්‍රය කොට ගෙන එක් විචල්‍යයක් අනෙක් විචල්‍යයට කොපමණ ගැලපේ ද යන්න පරීක්ෂා කළ හැකිය. එම අගය 0.5 ට අඩු නම් එහි ගැලපීමේ ප්‍රමාණය අඩුය. මෙහි 0.5 ට අඩු අගයක් නොමැති බැවින් එවැන්නක් නිගමනය කළ නොහැකිය.

අයිගන් අග හා සාධක අගයන් පිළිබඳ දැක්වෙන ප්‍රස්තාර සටහනට අනුව එහි පළමු සාධකයේ අගය ඉහළ අගයක් ගනී. එය ක්‍රමයෙන් පහත වැටී ඇති අතර දෙවැනි සාධකය අයිගන් අගය 1ට ආසන්න අගයක් ගනී.එම නිසාවෙන් වයස්ගත ජනගහනයේ ශ්‍රම සහභාගිත්වය කෙරෙහි බලපානු ලබන සාධක ප්‍රධාන වශයෙන් 3 ක් වේ.

ප්‍රස්ථාර සටහන 1 : අයිගන් අග සහ සාධක අගයන්



මූලාශ්‍රය : නියැදි සමීක්ෂණ දත්ත , 2023

ඉහත දැක්වෙන ප්‍රස්ථාර සටහන අනුව ප්‍රධාන සංරචකයන් ගණන ගණනය කිරීමට හැකියාව පවතී.ඒ අනුව 0 ට ආසන්න ලක්ෂයේ පවතින ප්‍රධාන සංරචක ප්‍රමාණය අධ්‍යනයට යොදා ගනී. මෙම අධ්‍යනය තුළදී මෙම පස්දාර සටහනට අනුව ප්‍රධාන සංරචකයන් 3ක් යැයි තීරණය කළ හැකිය.

වගු අංක 3 : සංරචකයන් නිර්මාණය කිරීම

	සංරචක		
	1	2	3
විවාහ නොවී සිටීම නිසා			0.625
දෛනික ජීවිකාව කරගෙන යෑම සඳහා	0.903		
කායික මානසික තෘප්තිය උදෙසා		0.830	
විශ්‍රාම වැටුප් ප්‍රමාණවත් නොවීම නිසා	0.905		
ඉතුරු කිරීම් සඳහා	0.905		
රැක බලා ගැනීම කෙනෙක් නොමැති නිසා			0.822
සෞඛ්‍යය වියදම් ඉහළ යාම නිසා	0.842		
ගෘහ මූලික තනතුරු දැරීම නිසා			0.672
සමාජ තත්වය රැක ගැනීම සඳහා		0.903	
රැකියා පුරප්පාඩු පිරවීම සඳහා		0.803	

මූලාශ්‍රය : නියැදි සමීක්ෂණ දත්ත , 2023

දෛනික ජීවිකාව කරගෙන යෑමට, සෞඛ්‍යය වියදම් ඉහළ යාම,විශ්‍රාම වැටුප් ප්‍රමාණවත් නොවීම නිසා සහ ඉතුරු කිරීම් සඳහා යන සාදක හතර එක් ප්‍රධාන සංරචකයක් ලෙසත් , රැකියා පුරප්පාඩු පිරවීම සඳහා, සමාජ තත්වය රැක ගැනීම සඳහා සහ කායික මානසික තෘප්තිය උදෙසා යන සාධක ත්‍රිත්වය තවත් එක්

සංරචකයක් ලෙසත් , ගෘහ මූලික තනතුරු දැරීම ,විවාහ නොවී සිටීම සහ රැක බලා ගැනීම කෙනෙක් නොමැති වීම යන සාදක අවසාන ප්‍රධාන සංරචකය ලෙසත් මෙම වගුවට අනුව හඳුනා ගත හැකිය.

රූප සටහන 1 ෘ ප්‍රධාන සංරචක නිර්මාණය කිරීම



මූලාශ්‍රය ෘ නියැදි සමීක්ෂණ දත්ත , 2023

මෙම සටහනේ දැක්වෙන පරිදි වයස්ගතවූවන්ගේ ශ්‍රම සහභාගීත්වය සඳහා බලපාන සාධක ප්‍රධාන

සංරචක තුනක් යටතේ බෙදා දක්වා ඇත. ඒ අනුව ශ්‍රම සහභාගීත්වය සඳහා බලපානු ලබන ප්‍රධාන සාධකයන් ලෙස ආර්ථික සාධක , සමාජීය සාධක සහ පවුල් පරිසරය ආශ්‍රිත බලපෑම් කරන සාධක ලෙස නිගමනය කළ හැකිය.

4.3 වයස්ගත ජනගහනයේ ශ්‍රම සහභාගිත්වය සඳහා බලපාන සාධක අතර ස්වායත්තාව පරීක්ෂා කිරීම

ඒ අනුව ශ්‍රම සහභාගිත්වය කෙරෙහි බලපාන ආර්ථික , සමාජීය හා පවුල් පසුබිම ආශ්‍රිත සාධක හා වයස්ගත ජනගහනයේ ශ්‍රම සහභාගිත්වය අතර සම්බන්ධයක් පවතින්නේද? යන්න ගොඩනගාගත් කල්පිත මත පිහිටා කාල් පියසන්ගේ කයිවර්ග පරීක්ෂාව මගින් පරීක්ෂා කරන ලදී.

වගු අංක 4: වයස්ගත ජනගහනයේ ශ්‍රම සහභාගිත්වය සහ එක් එක් සාධක අතර සම්බන්ධය

H_0 කල්පිතය	df	χ^2	P Value	C Value
H_0 : වයස්ගත ජනගහනයේ ශ්‍රම සහභාගිත්වය සඳහා ආර්ථික සාධක බලපෑමක් නොකරයි	8	44.860[a]	0.000	0.5565
H_0 : වයස්ගත ජනගහනයේ ශ්‍රම සහභාගිත්වය සඳහා සමාජීය සාධක බලපෑමක් නොකරයි	6	46.663[a]	0.003	0.5641
H_0 : වයස්ගත ජනගහනයේ ශ්‍රම සහභාගිත්වය සඳහා පවුල් පසුබිම ආශ්‍රිත සාධක බලපෑමක් නොකරයි	6	62.889[a]	0.000	0.6214

මූලාශ්‍රය : නියැදි සමීක්ෂණ දත්ත , 2023

වයස්ගත ජනගහනයේ ශ්‍රම සහභාගිත්වය සඳහා ආර්ථික සාධක බලපෑමක් නොකරයි යන කල්පිතයන්හි කයිවර්ග පරීක්ෂාවේදී එම විචල්‍ය අතර සම්බන්ධයක් පවතින බව පෙන්නුම් කර ඇත. එසේම ආපතිතතා සංගුණකයේ අගය මධ්‍යස්ථ වේ.

වයස්ගත ජනගහනයේ ශ්‍රම සහභාගිත්වය සඳහා සමාජීය සාධක බලපෑමක් නොකරයි යන කල්පිතයන්හි කයිවර්ග පරීක්ෂාවේදී එම විචල්‍ය අතර සම්බන්ධයක් පවතින බව පෙන්නුම් කර ඇත. එසේම ආපතිතතා සංගුණකයේ අගය මධ්‍යස්ථ වේ.

වයස්ගත ජනගහනයේ ශ්‍රම සහභාගිත්වය සඳහා පවුල් පසුබිම ආශ්‍රිත සාධක බලපෑමක් නොකරයි යන කල්පිතයන්හි කයිවර්ග පරීක්ෂාවේදී එම විචල්‍ය අතර සම්බන්ධයක් පවතින බව පෙන්නුම් කර ඇත. එසේම ආපතිතතා සංගුණකයේ අගය ප්‍රබල වේ.

5. සමාලෝචනය

වයස්ගත ජනගහනයේ ශ්‍රම සහභාගිත්වය සඳහා බලපාන විවිධ සාධක ඇත. මෙම ගැටලු සම්බන්ධව ලෝකය පුරා විවිධ පර්යේෂණ පවත්වා තිබේ. නමුත් ඒ එක් එක් පර්යේෂණ මගින් ලබාගත් නිගමනයන් එකිනෙකට වෙනස් වේ. එයට හේතුව එම පර්යේෂණ මගින් ලබා දුන් නිගමනය එම පර්යේෂණය සිදුකළ ප්‍රදේශයට හෝ රටට පමණක් අදාළ වීමයි.

වයස්ගත ජනගහනයේ ශ්‍රම සහභාගිත්වය හා ප්‍රජාව විද්‍යාත්මක සාධක අතර පවතින සම්බන්ධතාවය විමසීමේදී විවාහකත්වය, අධ්‍යාපන මට්ටම, ස්ත්‍රී පුරුෂ භාවය හා වයස් සීමාව යන ප්‍රජාව විද්‍යාත්මක සාධක සැලකිල්ලට ගැනුණි. එහිදී වයස්ගත ජනගහනය ශ්‍රම සහභාගීත්වය හා විවාහකත්වය, ස්ත්‍රී පුරුෂ පුරුෂ භාවය,අධ්‍යාපන මට්ටම, වයස් සීමාව යන සාධක අතර සම්බන්ධතාවයක් පවතින බවත් සීමාව හා ශ්‍රම සහභාගීත්වය අතර ඉතා ප්‍රබල සම්බන්ධතාවයක් පවතින බව කයිවර්ග පරීක්ෂාව ඇසුරෙන් සිදුකරන ලද විශ්ලේෂණය හරහා නිගමනය කිරීමට හැකි විය.

වයස්ගත ජනගහනය ශ්‍රම සහභාගීත්වය සඳහා බලපාන හේතු සාධක පිළිබඳ අධ්‍යයනය කිරීම මෙම අධ්‍යයනයේ ප්‍රධාන අරමුණ වේ. ඒ අනුව වයස්ගත ජනගහනය ශ්‍රම සහභාගීත්වය සඳහා බලපාන හේතු සාධක පිළිබඳ අධ්‍යයනයේදී ප්‍රධාන සාධක ලෙස ආර්ථික සාධක, සමාජීය සාධක සහ පවුල් පරිසරය ආශ්‍රිත බලපෑම් කරන සාධක ලෙස ප්‍රධාන සංරචක තුනක් කෙරෙහි අවධානය යොමු කර එම සාධකයන් තුළින් කුඩා සාධක 10 ක් කෙරෙහි අවධානය යොමු කිරීම තුළින් නිගමනයන්වලට එළඹී ඇත. මෙම ප්‍රධාන සාධක අතුරින් පවුල් පරිසරය ආශ්‍රිතව බලපානු ලබන සාධක වයස්ගතවූවන් රැකියාවල නිරත වීමට ප්‍රබලම බලපා ඇත. අර්ථික හා සමාජීය සාධක මධ්‍යස්ථ ලෙස බලපෑම් කර ඇති බව මෙම අධ්‍යයනය තුළින් නිගමනය කළ හැකිය.

ආශ්‍රිත ග්‍රන්ථ

අබේකෝන්, ඒ. ටී. පී. (1999), "ශ්‍රී ලංකාවේ ජනගහනය වයස් ගත වීම", ආර්ථික විමසුම, ශ්‍රී ලංකා බැංකුව,කොළඹ.

චන්ද්‍රකාන්ති. යූ. පී. එන්. (2011). ශ්‍රී ලංකාවේ ජනසංඛ්‍යාව වියපත්වීම සහ එයින් උද්ගතවන සමාජ - ආර්ථික බලපෑම්.භූගෝල විද්‍යා අධ්‍යයන අංශය, කැළණිය විශ්වවිද්‍යාලය, කැළණිය.

ජන ලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව.(2021). ශ්‍රම බලකා සමීක්ෂණ වාර්තාව, ජන ලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව.

ජන ලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව.(2012). නිවාස සංගණනය, ජන ලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව.

ද සිල්වා, ඉන්ද්‍රලාල් සහ සමරස්කර දර්ශිකා. (2005). ශ්‍රී ලංකාවේ ජනසංඛ්‍යාව වයස්ගත වීම සහ ඒ තුළින් පැන නගින ගැටලු , දෙසතිය, රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව.

නිමේෂිකා. පී. ඒ. ටී. (2015). ශ්‍රී ලංකාවේ වියපත් ජනගහනය පිළිබඳ අධ්‍යයනය, සරසවි ලේඛා.

පතිරගේ. ජේ .එම්. පී. (2010). ජනගහනය වියපත්වීම සහ සමාජ ආර්ථික ප්‍රතිවිපාක. සබරගමුව විශ්වවිද්‍යාලය

සෙව්වන්දි. එච්. (2020). *ශ්‍රී ලංකාවේ වියපත් ජනගහනය වර්ධනය වීම සහ ආර්ථිකයට ඇති කරනු ලබන බලපෑම.* http:// repository. kln.ac.lk/handle/123456789/22386

Abeykoon, A. (2015, jan 26). Ageing and the health sector in Sri Lanka . *Ceylon Medical Journal, 45*(2) , 52-54. Retrieved Feb 3,2023, from doi:10.4038/cmj.v45i2.7999

Abeykoon, A. (1996). Demographic implication of health care in Sri Lanka. *Journal of Asia Pac Popul,11*(2),47-58. Retrieved feb 23, 2023, from https://pubmed.ncbi.nlm.nih.gov/1234764/

Adhikari, R., Soonthorndhada, K., & Haseen, F. (2011). Labor force participation in later life :Evidence from a cross sectional study in Thiland. *BMC Geriatrics, 11*(2).Retrieved March 15,2023, from doi:https://doi.org/10.1186/1471-

Department of Census and Statistics. (2016). Health Survey Report . Ministry of Health. http://www.statistics.gov.lk/

Department of Census and Statistics. (2022). http://www.statistics. gov.lk/Population/StaticalInformation/VitalStatistics

Department of Census and Statistics. (2015). Increasing of Elderly population in Sri Lanka. Colombo.

Journal of Social Statistics *Page 61 - 70*
JSS (2023) Vol (10) Issue (1)

Factors Influencing Females Labour Force Participation in Sri Lanka

Y.M.A.K. Yaparathne[1]

Abstract

According to the reports from 2017 to 2022, female who report the higher percentage of the population of Sri Lanka. That is, it has been recorded as 51.7% in 2017 and 51.8% in 2022. But in relation to those years, the percentage of female labour force participation is very low. It is 36.6% in 2017 and 33.6% in 2022 first quarter. Also, in 2021, 21% of female in the public sector and 37% in the private sector have been employed. Thus, despite the high percentage of working age female population, females are not participating the labour force due to some reasons. Accordingly, the main objective of this study is to study the factors that influence female labour force participation. For this study, 100 females living in the Colombo district of the Western Province were selected under the simple random sampling method. Questionnaire method and Interviews have been used to collect data, and relevant data has been presented using tables and graphs and has also been analysed by factor analysis, and Chi-square test. Accordingly, it was found that Social, Economic, and Demographic factors influence the female labour force participation, but mainly Economic factor influence. A removal of the barriers to participation in the jobs created and existing in the country for the women population, who report the highest percentage of the population in Sri Lanka and making the necessary provisions to engage in jobs without gender discrimination and to support the labour force of the country's economy a positive effect on the level.

Keywords: Female labour force participation, Labour force, Economic, Social, Demographic

---

[1] Department of Social Statistics, University of Kelaniya
yaparathnekumari@gmail.com

1.Introduction

Labour Force participation means the active engagement or willingness of people of working age to engage in economic activities included in the system of national accounts (SNA) (Semasinghe, 2017). The term labour typically refers to a measure of the work that people do and its often compared with the other variables in production. Labour is a key input in the production of goods and services and is, therefore a critical determinant of economic growth (Mahr,2022). The size of labour force in a country depends on the number of individuals of working age participating in the labour market (Semasinghe, 2017). The working age population is defined as those age 15 to 64 (OECD, 2023).

Labour Force comprises people ages 15 and older who supply labour force the production of goods and services during a specified period. It includes people who are currently employed and people who are unemployed but seeking work as well as first time job seekers. Not everyone who works is included. However, unpaid workers, family workers, and students are often omitted, and some countries don’t count members of the armed forces. Labour Force size tends to vary during the year as seasonal workers enter and leave (World Bank, 2017).

An individual’s decision to participate in the labour market depends on the gap between the individual’s reservation wage rate and the market wage rate. The reservation wage rate is the minimum wage level if which an individual will accept to work. This definition of reservation wage implies that an industrial will not work at all if the market wage is less than the reservation wage and the individual will enter the labour force only if the market wage exceeds the reservation wage (Samarakoon & Mayadunne, 2018).

World labour force participation rate in 2021 is 65.3% and female labour force participation is 53% in 2021. In 2020 Maldives female labour force participation between age 15 – 64 was 41.3%, in Afghans 17.1%, Bhutan 55.6%, Pakistan 24.6%, Bangladesh 38.812%, India 22.88%, Nepal 30.01% and Sri Lanka 37.614%. (World bank, 2023).

Regarding the first quarter of 2022, the highest female labour force participation is recorded in the age group of 50 – 54 years as 49.3% and the

lowest labour force participation as 4.9% in the age group of 15 – 19. Among them, economically active females are reported as 34.1 in urban areas, 35.3% in rural areas and 40.9% in estates. Females who are not economically active have been recorded as 72.6% in urban, 73.7% in rural and 69.1% in estates (Department of Census and Statistics, 2022).

A women's choice to work can be influenced by a number of circumstances, including age, marital status, education, husband's salary, and the number of children she has. Depending on which nation has attained a higher level of economic development than another, there are differences in the degree of correlation between each indicator and the female labour force participation rate (Gunawardhana, 2015).

Objective - Study the factors that influence female labour force participation.

2. Literature Review

"Contretas, Mello & Puentes, (2010)" have found that labour supply in Chille using data from the National Household Survey in 1990, 1996 and 2003. Probit models are estimated using those data. Labour supply depends on education for male and female both, although it is less so for most educated men than it is for women. The marginal effect of marriage is more positive or less negative, for males than for females. These effects can be better understood by noting that participation increases with marriage among indigenous males in Chile but declines significantly among married indigenous female who are also less likely to be employed than their unmarried counterparts.

"Nude and Serumage & Magid, (2012)" have conducted determinants of labour force participation. They found relationship to be negative for females and male in age 24 – 34 and female in age 34 – 65 have strong significant positive impact on labour force participation.

"N. Lari, A. Awadalla, M.AI-Ansari & E. Elmaghraby, (2022)" have found determinants of female labour force participation: implications for policy in Qatar. They collected data via a national telephonic survey and used simple random sampling method to choose sample units. They found education level, marital status, & age affect women's participation in the labour force. In this study, it is concluded that attitudes towards female labour force participation

are influenced by individual level characteristics and that marital status is a significant variable leading to differences in female labour force participation support.

Impact of covid – 19 labour force participation in Brazil was conducted by "J.V. Cateria, L. Savard & E.D.O. Almeida, (2022). They used the pnad – covid 19 database of the Brazillian Institute of Geography and Statistics round November 2020 to the study. They found that females participate less in the labour market than males because they are disadvantaged in many dimensions. The literacy rate of females is lower than that the males. This study concluded that female participate in labour force less than men because women are disadvantaged in many dimensions.

Women's labour force participation in Sri Lanka: An inquiry into the factors influencing women's participation in the labour market was conducted by "W.M. Semasinghe, (2017)". This study used mixed method approach, secondary data collected from the labour force surveys of the Department of Census and Statistics and from the reports of the Central Bank of Sri Lanka. Qualitative data collected from quota sampling method and sample size as 250 units and Questionnaire method used to collect data. According to this study among the variables, females' unemployment statistically significant at 90% confidence level. It means that when unemployment among females increases, female labour force participation decreases. The number of women who have never participated in the labour force is very small and many have been actively participating in the economy for several years and have left due to various reasons such as marriage, having children, poor health, and difficulty in the workplace. The study also concluded that many factors including socio-cultural and labour market conditions have contributed.

"S.C. Wijethunga, B. Amarathunga & K.N.S. Perera, (2022)" have found that determinants of female labour force participation in Sri Lanka. They used 387 of women sample size based on Mogen's table. Questionnaire method used to collect data and they found level of educational qualifications, marital status, and the availability of different sources of income influenced to female labour force participation is Sri Lanka.

"L.U. Mallawarachchi & T.S.G. Peiris, (2020)" study the factors affecting female labour force participation is Sri Lanka. This study used 45,210 of

sample size and based on the Annual Labour Force Survey data in 2016 gathered from the Department of Census and Statistics in Sri Lanka. The analysis used seven factors and those females who were is the age category of 40 years and above shows the highest contribution on the labour force participation and most of those women were separated. Also, they found majority in the female labour force represent the Indian Tamil and others in different categories of religion. It is further included through this study that as a level of educational qualification increases, there is a tendency for women to participate in the labour force.

3. Methodology

Both secondary and primary data were used in this study. The analysis was carried out data collected from a randomly selected sample of 100 females who are in labour force in the Colombo District of Western Province. The Yamani method has been used to get the sample size and calculated nonresponsive rate to avoid errors in the selection of the relevant sample.

4. Results and Discussion

According to the figure 1, in the sample 8% of the females are belong to age category between 15 – 24, 19% between 25 – 29, 30% between 35 – 44, 28% between 45 -54 and 15% between 55 - 64.

Figure 1: Sample distribution of the females participating in labour force by age



Source: Survey data, 2024

Table 1: Test of independence between variables

Null Hypothesis	χ^2	d.f.	Significant Value	Contingency – Coefficient Value	Decision
H0: Female labour force participation has no significant association with Level of educational qualifications	76.6	3	0.000	0.66	H0: Rejected
H0: Female labour force participation has no significant association with Marital status	45.400	2	0.000	0.56	H0: Rejected
H0: Female labour force participation has no significant association with Age	69.559	3	0.000	0.64	H0: Rejected
H0: Female labour force participation has no significant association with Religion	83.246	3	0.000	0.67	H0: Rejected
H0: Female labour force participation has no significant association with Availability of different sources of income	19.077	2	0.000	0.4	H0: Rejected
H0: Female labour force participation has no significant association with Family influence	76.364	4	0.000	0.66	H0: Rejected
H0: Female labour force participation has no significant association with Number of children	17.271	2	0.000	0.4	H0: Rejected
H0: Female labour force participation has no significant association with Unfavorable working conditions	20.857	2	0.000	0.41	H0: Rejected
H0: Female labour force participation has no significant association with Low wages	58.324	2	0.000	0.61	H0: Rejected
H0: Female labour force participation has no significant association with Poor work environment	96.6	3	0.000	0.70	H0: Rejected
H0: Female labour force participation has no significant association with Socio cultural barriers	59.570	2	0.000	0.61	H0: Rejected
H0: Female labour force participation has no significant association with Duration of service	46.014	2	0.000	0.56	H0: Rejected

Source: Survey data, 2024

Karl Pearson's chi-square test was used to test whether there is a relationship between the female labour force participation and following variables which are considered in labour force participation. The purpose of this is to use significant variables (95% confidence level was used for the chi-square test and thus the error level considered here is $\alpha = 0.05$) for factor analysis.

If the significant value is less than 0.05, the null hypothesis is rejected and if not, the null hypothesis is accepted. If the C value is between 0 – 0.199, relationship is very weak, 0.2 – 0.399 relationship is weak, 0.4 – 0.599 relationship is moderate, 0.6 – 0.799 relationship is strong, and 0.8 – 0.999 relationship is very strong. According to this, Labour force participation have strong relationship with Level of educational qualifications, Age, Religion, Family influence, Low wages, Poor work environment, and Socio-cultural barriers other variables have moderate relationship. It is shown that the significant value of all above-mentioned variables is less than 0.05, therefore all variables have a significance association with the female labour force participation.

The methods used for factor rotation are Varimax, Quartimax, Equimax. It also states that factor analysis should not be analyzed without rotating the factors. Among these factor rotations, varimax i.e. Kaiser Varimax is the most widely used method. According to the Varimax method in the principal component analysis method, the variables have been divided under 3 main components that influence in female participation in labour force by factor analysis.

According to the Varimax method in the principal component analysis method, the above variables have been divided under 3 main components that influence to female labour force participation.

Accordingly, the first component is related to Religion, Unfavourable working conditions, Poor work environment, Socio cultural barriers, and Duration of service, which influence female participation of labour force. So, it can be called "Social Impact".

The second component can be called the "Economic Impact" as it is related to Availability of different sources of income, Number of children and Low wages etc.

The third component consists of Religion, Level of educational qualifications, Age, Family influence, and Marital status so it can be called "Demographic Impact".

Table 2: Test of independence between variables

Variable	Selected Components		
	1	2	3
Level of educational qualifications	0.544	0.170	**0.741**
Age	0.615	-0.001	**0.743**
Religion	**0.949**	0.158	0.077
Unfavorable working conditions	**0.916**	0.059	0.121
Availability of different sources of income	0.008	**0.952**	0.039
Number of children	0.678	**0.684**	0.094
Poor work environment	**0.963**	0.045	-0.088
Low wages	0.653	**0.710**	0.114
Socio cultural barriers	**0.969**	-0.088	-0.012
Family influence	0.031	-0.035	**0.969**
Marital status	0.622	0.073	**0.755**
Duration of service	**0.952**	-0.138	0.127

Source: Survey data, 2024

A multivariate statistical technique known as confirmatory factor analysis (CFA) is used to assess how effectively measured variables represent various constructs.

Religion, Unfavourable working conditions, Poor work environment, Socio cultural barriers, and Duration of service

When testing the hypothesis that Social impact does not affect the female labour force participation, the null hypothesis is rejected because the p value (0.000) is less than the 0.05 confidence level. Accordingly, it is said that Social impact influences the female labour force participation.

When testing the hypothesis that Economic impact does not affect the female labour force participation, the null hypothesis is rejected because the p value

(0.002) is less than the 0.05 confidence level. Accordingly, it is said that Economic impact influences the female labour force participation.

When testing the hypothesis that Demographic impact does not affect the female labour force participation, the null hypothesis is rejected because the p value (0.000) is less than the 0.05 confidence level. Accordingly, it is said that Demographic impact influences the female labour force participation.

According to the contingency coefficient values are strong of all associations but female labour force participation and economic impact association have highest value.

Table 3: Test of independence between female labour force participation and social, economic, and demographic factors.

Null hypothesis	χ^2	d.f.	Significant Value	Contingency-Coefficient value	Decision
H0: Female labour force participation has no significant association with Social impact	88.000	15	0.000	0.68	H0: Rejected
H0: Female labour force participation has no significant association with Economic impact	96.6	5	0.002	0.70	H0: Rejected
H0: Female labour force participation has no significant association with Demographic impact	52.2	4	0.000	0.59	H0: Rejected

Source: survey data, 2024

5. Conclusion and Recommendations

The purpose of this study was to study the factors influencing female labour force and accordingly, 3 factors were identified through factor analysis.

Finally, through the chi-square test it was analysed that the economic factor has a greater impact on female labour force participation. Accordingly, it can be concluded that females are mainly influenced by three factors when participating to the labour force and among them Economic factor (Availability of different sources of income, Number of children and Low wages) have a special effect.

References

Contreras, M. &. (2010). Determinants of labour force participation in Chile. 13.

Department of Census and Statistics, DCS, Sri Lanka, *Sri Lanka Labour Force Statistics First Quarter 2022*

Gunawardhana, N. (2015). *Factors influence on female labour force participation in Sri Lanka.*

J.V. Cateria, L. S. (2022). Impact of covid - 19 labour force participation in Brazil. 17.

L.U. Mallawarachchi, T. P. (2020). A study of the factors affecting female labour force participation in Sri Lanka. *Sri Lankan journal of Business Economics,* 19.

Mayadunne, S. S. (2018). An exploratary study on low labour force participation of women in Sri Lanka. *Sri Lanka journal of Social Sciences,* 151.

N. Lari, A. A.-A. (2022). Determinants of female labour force participation: implications for policy in Qatar. 19.

Nude, S. &. (2010). Determinants of labour force participation.

S.C. Wijethunga, B. A. (2022). Determinants of female labour force participation in Sri Lanka . *International conference on contemporary management*, 20.

World bank, World Development Indicaters (2023). *Labor force participation rate, female .*

කර්තෘ නාමාවලිය

ඩයස්, පී. පී. ඒ. එස්.	01
සඳමාලි, එල්.ඩබ්.සී.	48

Author Index

Jayasundara, D. M. T. M.	16
Kumara, M. S. M. Lakshani, W. C.	33
Yaparathne, Y. M. A. K.	61